# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**2023 නොවැම්බර් මස 10 වැනි දින**

**II වන කොටස**

**අතිරේකය**

**(2023.11.10 දින නිකුත් කරන ලදී)**


# සුරක්ෂිතලත් ගනුදෙනු

**සුරක්ෂිතලත් ගනුදෙනු ලියාපදිංචි කිරීමේ අධිකාරිය පිහිටුවීම මඟින් චංචල දේපළ පිළිබඳ සුරක්ෂිතලත් ගනුදෙනු විධිමත් කිරීම පිණිස වූ ආයතනික රාමුවක් ඇති කිරීමට විධිවිධාන සැලැස්වීම සඳහා ද; එම අධිකාරියේ බලතල, කාර්ය සහ කර්තව්‍ය සඳහන් කිරීම සඳහා ද; ස්වකීය ණයකරුවන්ගේ චංචල දේපළ පිළිබඳ තරගකාරී සුරකූ අයිතිවාසිකම් ඇති ණය හිමියන් අතර ප්‍රමුඛතා නිශ්චය කිරීම උදෙසා විධිවිධාන සැලැස්වීම සඳහා ද; සුරකූ ගිවිසුම්වල පාර්ශ්වයන්ගේ අයිතිවාසිකම් සහ යුතුකම් සඳහන් කිරීම සඳහා ද; චංචල දේපළවල සුරකූ අයිතිවාසිකම් පිළිබඳ රෙජිස්ටරයක් පිහිටුවා පවත්වාගෙන යාමට විධිවිධාන සැලැස්වීම සඳහා ද; 2009 අංක 49 දරන සුරක්ෂිතලත් ගනුදෙනු පනත ඉවත් කිරීම සඳහා ද; සහ ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කරුණු පිළිබඳව විධිවිධාන සැලැස්වීම සඳහා ද වූ පනත් කෙටුම්පතකි.**

මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමාගේ
නියමය පරිදි පළකරන ලදී


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක.

මිල : රු. 108.00 තැපැල් ගාස්තුව : රු. 100.00



*මෙම ගැසට් අතිරේකය www. documents. gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

## සුරක්ෂිතලත් ගනුදෙනු

එල්.ඩී.-ඕ. 47/2015

**සුරක්ෂිතලත් ගනුදෙනු ලියාපදිංචි කිරීමේ අධිකාරිය පිහිටුවීම මඟින් චංචල දේපළ පිළිබඳ සුරක්ෂිතලත් ගනුදෙනු විධිමත් කිරීම පිණිස වූ ආයතනික රාමුවක් ඇති කිරීමට විධිවිධාන සැලැස්වීම සඳහා ද; එම අධිකාරියේ බලතල, කාර්ය සහ කර්තව්‍ය සඳහන් කිරීම සඳහා ද; ස්වකීය ණයකරුවන්ගේ චංචල දේපළ පිළිබඳ තරගකාරී සුරකු අයිතිවාසිකම් ඇති ණය හිමියන් අතර ප්‍රමුඛතා නිශ්චය කිරීම උදෙසා විධිවිධාන සැලැස්වීම සඳහා ද; සුරකු ගිවිසුම්වල පාර්ශ්වයන්ගේ අයිතිවාසිකම් සහ යුතුකම් සඳහන් කිරීම සඳහා ද; චංචල දේපළවල සුරකු අයිතිවාසිකම් පිළිබඳ රෙජිස්ටරයක් පිහිටුවා පවත්වාගෙන යාමට විධිවිධාන සැලැස්වීම සඳහා ද; 2009 අංක 49 දරන සුරක්ෂිතලත් ගනුදෙනු පනත ඉවත් කිරීම සඳහා ද; සහ ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කරුණු පිළිබඳව විධිවිධාන සැලැස්වීම සඳහා ද වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

**1.** (1) මේ පනත 2023 අංක        දරන සුරක්ෂිතලත් ගනුදෙනු පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

*ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වන දිනය*

(2) මේ වගන්තියේ විධිවිධාන හැර මේ පනතේ විධිවිධාන, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මඟින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන (මේ පනතේ “නියමිත දිනය” යනුවෙන් සඳහන් කරනු ලබන) යම් දිනයක සිට ක්‍රියාත්මක විය යුතු ය.

(3) මේ වගන්තියේ විධිවිධාන පනත් කෙටුම්පත පාර්ලිමේන්තු පනතක් බවට පත්වන දින සිට ක්‍රියාත්මක විය යුතු ය.

### I වන කොටස

### මූලික කරුණු

**2.** 3 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව, මේ පනතේ විධිවිධාන -

*පනත අදාළ වීම*

(අ) යම් ගනුදෙනුවක ස්වරූපය කුමක් ද යන්න පිළිබඳව සහ වත්කම් වර්ගය පිළිබඳව හෝ සුරකු අයිතිවාසිකමේ විෂය වස්තුව වන

සමපාර්ශ්වීය ද්‍රව්‍යයට හිමිකම ඇති තැනැත්තා පිළිබඳව හෝ නොසලකමින් -

(i) පුද්ගලික දේපළ උකස් කිරීමක්, කොන්දේසි සහිතව විකිණීමක්, ඝණ පත්‍රයක්, ස්ථිර ඝණ භාරයක්, චල ඝණ භාරයක්, ඔඩපනය කිරීමක්, භාර ප්‍රතිඥා පත්‍රයක් හෝ භාර ලදුපතක්; සහ

(ii) ගෙවීමක් හෝ වගකීමක් ඉටු කිරීම සුරක්ෂිත කරන අවස්ථාවක, පුද්ගලික දේපළ පත්‍ර පවරා දීමක්, භාරදීමක්, බදු දීමක් හෝ පැවරීමක්,

ද ඇතුළත්ව එහෙත් ඊට සීමා නොවී සුරකු අයිතිවාසිකමක් හරයාත්මකව ඇති කරවන සෑම ගනුදෙනුවකට ම;

(ආ) ගිණුමක් හෝ පුද්ගලික දේපළ පත්‍රයක් පැවරීමක දී එම පැවරීම මගින් ගෙවීමක් හෝ වගකීමක් ඉටු කිරීම සුරක්ෂිත කරනු නොලබන අවස්ථාවක දී වුව ද, එවැනි ගිණුමක් හෝ පුද්ගලික දේපළ පත්‍රයක් පැවරීමකට; සහ

(ඇ) අවුරුදු එකකට වැඩි කාලසීමාවක් සඳහා වූ බද්දක් සම්බන්ධයෙන් වන විට, එම බදු දීම මගින් ගෙවීමක් හෝ වගකීමක් ඉටු කිරීම සුරක්ෂිත කරනු නොලබන අවස්ථාවක දී වුව ද, එවැනි බදු දීමකට,

අදාළ විය යුතු ය.

මේ පනත අදාළ වීමෙන් නිදහස් කිරීම

**3.** (1) මේ පනතේ අන්‍යාකාරයකට විධිවිධාන සලස්වා ඇත්නම් මිස, මේ පනතේ විධිවිධාන -

(අ) අන්‍යාකාරයකට විධිවිධාන සලස්වා ඇත්නම් මිස, යම් නීතියක් මගින් හෝ ඒ යටතේ ප්‍රදානය කරන ලද යම් කැප අයිතියකට සහ අධිකරණය විසින් පිළිගනු ලබන යම් ඒකමතික නොවන කැප අයිතියකට;

(ආ) සමපාර්ශ්වීය ද්‍රව්‍යයකට සිදු වූ පාඩුවක් හෝ අලාභයක් සඳහා හානිපූර්ණයක් වශයෙන් හෝ වන්දි වශයෙන් රක්ෂණ ඔප්පුවක් යටතේ ගෙවිය යුතු මුදල් හෝ වෙනත් වටිනාකමක් පිළිබඳ අයිතිය පැවරීමක් හැර, වාර්ෂික ගෙවීමේ ගිවිසුමක් හෝ රක්ෂණ ඔප්පුවක් සම්බන්ධයෙන් වූ හෝ ඒ ගිවිසුම හෝ ඒ ඔප්පුව යටතේ වූ බැඳියාවක් හෝ හිමිකම්පෑමක් පැවරීමකට;

(ඇ) භාරගත් යම් වැඩක් හෝ ඉටු කළ යම් සේවයක් සඳහා වූ වර්තමාන හෝ අනාගත වේතන, වැටුප්, පාරිශ්‍රමික හෝ කොමිස් හෝ වෙනත් ස්වරූපයක යම් ගෙවීමක් පිළිබඳ බැඳියාව පවරාදීම හෝ පැවරීම නීතිය මඟින් තහනම් කර ඇත්නම්, එවැනි පවරාදීමකට හෝ පැවරීමකට;

(ඈ) ගිවිසුමක් යටතේ පැවරුම්කරුගේ වගකීම් ඉටු කිරීමට නියම වී ඇති පැවරුම්ලාභියකු වෙත ඒ ගිවිසුම යටතේ වන යම් ගෙවීමක් පිළිබඳ උපචිත නොවූ අයිතියක් පැවරීමකට;

(ඉ) (i) යම් නිශ්චල දේපළක සවිකිරීමක් හා සම්බන්ධ බැඳියාවක්; හෝ

(ii) යම් නිශ්චල දේපළක උකසක්, ඍණ භාරයක් හෝ බද්දක් යටතේ වන ගෙවීමකට ඇති අයිතිය පවරාදීමේ දී, ඒ පවරාදීම මඟින් ඒ නිශ්චල දේපළ කෙරෙහි වන පැවරුම්කරුගේ බැඳියාව භාරදීම හෝ පැවරීම සිදු නොවන අවස්ථාවක, එවැනි පවරාදීමක්,

හැර, යම් නිශ්චල දේපළ පිළිබඳ යම් උකසක්, ඍණ භාරයක් හෝ බද්දක් ද ඇතුළත්ව, ඒ දේපළ සම්බන්ධයෙන් යම් බැඳියාවක් ඇති කිරීමකට හෝ පැවරීමකට;

(ඊ) ව්‍යාපාරයක් විකිණීමේ දී එසේ විකිණීමෙන් පසුව විකුණුම්කරු එම ව්‍යාපාරය තවදුරටත්

පාලනය කරන අවස්ථාවක දී හැර, එම ව්‍යාපාරය තුළින් උද්ගත වූ ද, එම ව්‍යාපාරය විකිණීමේ කොටසක් වන්නා වූ ද, ගිණුම්, පුද්ගලික දේපළ පත්‍ර හෝ භාණ්ඩ විකිණීමකට;

(උ) පැවරුම්කරු වෙනුවෙන් ගිණුම් රැස් කිරීම පහසු කිරීමේ කාර්යය සඳහා ම පමණක් කරන ලද ගිණුම් පැවරීමකට;

(ඌ) අතරමැදි සුරැකුම්පත්වලට;

(එ) (90 වන අධිකාරය වූ) බඩු උගස්ගන්නන්ගේ ආඥාපනතට යටත් වන ගනුදෙනුවකට;

(ඒ) සියලු නොපියවූ ගනුදෙනු අවසන් කිරීමේ දී අයවීමට ඇති යම් මුදලක් හැර, යම් ගෙවීමක් බේරුම් කිරීම සම්බන්ධයෙන් අදාළ වන යම් ගිවිසුමක් මගින් පාලනය වන මූල්‍ය ගිවිසුම්වලින් හෝ එවැනි ගිවිසුම් යටතේ උද්ගත වන ගෙවීම්වලට; සහ

(ඔ) (203 වන අධිකාරය වූ) මෝටර් වාහන පනත, 1979 අංක 51 දරන ශ්‍රී ලංකා වරායවල් පිළිබඳ අධිකාරිය පනත, 1971 අංක 52 දරන වෙළෙඳ නැව් පනත සහ 2002 අංක 34 දරන ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය පනත යටතේ භාණ්ඩ ලියාපදිංචි කර ඇති අවස්ථාවක, ණයකරු සතුව පවත්නා එම භාණ්ඩවල යම් බැඳියාවක් පැවරීමකට,

අදාළ නොවිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ (ඌ) ඡේදයේ කාර්යය සඳහා "අතරමැදි සුරැකුම්පත් " යන්නෙන්, සුරැකුම්පත් ගිණුමකට බැර කරන ලද සුරැකුම්පත් සහ සුරැකුම්පත් ගිණුමකට සුරැකුම්පත් බැර කිරීමේ ප්‍රතිඵලයක් ලෙස සුරැකුම්පත් සම්බන්ධයෙන් ඇති වන අයිතිවාසිකම් හෝ බැඳියාවන් අදහස් වේ.

පරිපූර්ණත්වයට පත්වීම

**4.** සුරකු අයිතිවාසිකමක් -

(අ) මේ පනතේ III වන කොටස ප්‍රකාරව වලංගු ලෙස ඇති කරනු ලැබ ඇති විට; සහ

(ආ) මේ පනත මඟින් විධිවිධාන සලසා ඇති පරිදි පරිපූර්ණත්වයට පත්වීමට අවශ්‍ය වන්නා වූ සියලු ක්‍රියාමාර්ග සම්පූර්ණ කර ඇති විට,

ඒ සුරකු අයිතිවාසිකම පරිපූර්ණත්වයට පත්ව ඇති ලෙස සලකනු ලැබිය යුතු ය.

පරිපූර්ණ නොවූ සුරකු අයිතිවාසිකම් ද්විතීයික වීම

**5.** (1) සමපාර්ශ්වීය ද්‍රව්‍යයක් හා සම්බන්ධ පරිපූර්ණ නොවූ සුරකු අයිතිවාසිකමක් -

(අ) පරිපූර්ණ වූ සුරකු අයිතිවාසිකමක් පිළිබඳ බැඳියාවට;

(ආ) නඩු තීන්දුවක් පිළිබඳ දැන්වීම රෙජිස්ට්‍රාර්වරයා වෙත ලියාපදිංචි කරන ලද අවස්ථාවේ දී ඒ සුරකු අයිතිවාසිකම පරිපූර්ණත්වයට පත්ව නො තිබුණු විටෙක, එම නඩු තීන්දුව පිළිබඳ දැන්වීම රෙජිස්ට්‍රාර්වරයා වෙත ලියාපදිංචි කර ඇති ණය හිමියකුගේ බැඳියාවට; සහ

(ඇ) (ආ) ඡේදයේ සඳහන් ණය හිමියකුගේ බැඳියාවට යටත්ව, චංචල දේපළ බෙදා හැරීමකට සහභාගී වීමට යම් නීතියක් යටතේ යම් තැනැත්තකුට ඇති ව්‍යවස්ථාපිත හෝ අන්‍යාකාරයක අයිතිවාසිකමකට,

ද්විතීයික විය යුතු ය.

(2) (අ) සමපාර්ශ්වීය ද්‍රව්‍යයකට ඇති පරිපූර්ණ නොවූ සුරකු අයිතිවාසිකමක් -

(i) වස්තු භංගත්වය සිදු වූ අවස්ථාවේ දී සුරකු අයිතිවාසිකම පරිපූර්ණ වී නොතිබුණේ නම්, වස්තු භංගත්ව නඩු කටයුතුවල දී පැවරුම්ලාභියකුට එරෙහිව; හෝ

(ii) සමාගමක් ගණන් බේරා වසා දැමීමේ ආඥාව කරනු ලබන අවස්ථාවේ දී සුරකු බැඳියාව පරිපූර්ණ වී නොතිබුණේ නම්, 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ පත් කරනු ලබන ඇවරකරුවකුට එරෙහිව,

බලාත්මක නොවිය යුතු ය;

(ආ) පුද්ගලික දේපළ පත්‍රයක හෝ හිමිකම් ලේඛනයක හෝ භාණ්ඩවල පරිපූර්ණ නොවූ සුරකු අයිතිවාසිකමක පැවරුම්ලාභියකු සම්බන්ධයෙන් වන විට -

(i) ඒ පැවරුම්ලාභියා, සමපාර්ශ්වීය ද්‍රව්‍ය පිළිබඳ බැඳියාව අත්කර ගන්නේ ගෙවීමක් හෝ වගකීමක් ඉටු කිරීම සුරක්ෂිත නො කරන ගනුදෙනුවක් යටතේ නම්;

(ii) ඒ පැවරුම්ලාභියා වටිනාකම ලබා දෙන්නේ නම්; සහ

(iii) ඒ පැවරුම්ලාභියා සමපාර්ශ්වීය ද්‍රව්‍ය ලබා ගන්නේ සුරකු අයිතිවාසිකම පිළිබඳ දැනුම නොමැතිව නම්,

ඒ පැවරුම්ලාභියාට එරෙහිව ඒ පරිපූර්ණ නොවූ සුරකු අයිතිවාසිකම බලාත්මක නො විය යුතු ය; සහ

(ඇ) ගිණුම් හැර වෙනත් ස්පර්ශනීය ද්‍රව්‍යවල පරිපූර්ණ නොවූ සුරකු අයිතිවාසිකමක පැවරුම්ලාභියකු සම්බන්ධයෙන් වන විට-

(i) ඒ පැවරුම්ලාභියා සමපාර්ශ්වීය ද්‍රව්‍ය පිළිබඳ බැඳියාව අත්කර ගන්නේ ගෙවීමක් හෝ වගකීමක් ඉටු කිරීම සුරක්ෂිත නොකරන ගනුදෙනුවක් යටතේ නම්; සහ

(ii) ඒ පැවරුම්ලාභියා වටිනාකම ලබා දෙන්නේ සුරකුු අයිතිවාසිකම පිළිබඳ දැනුම නොමැතිව නම්,

ඒ පැවරුම්ලාභියාට එරෙහිව ඒ පරිපූර්ණ නොවූ සුරකුු අයිතිවාසිකම බලාත්මක නොවිය යුතු ය.

## II වන කොටස

## සුරක්ෂිතලත් ගනුදෙනු ලියාපදිංචි කිරීමේ අධිකාරිය පිහිටුවීම

සුරක්ෂිතලත් ගනුදෙනු ලියාපදිංචි කිරීමේ අධිකාරිය පිහිටුවීම

**6.** (1) (මේ පනතේ "අධිකාරිය" යනුවෙන් සඳහන් කරනු ලබන) සුරක්ෂිතලත් ගනුදෙනු ලියාපදිංචි කිරීමේ අධිකාරිය නම් වූ අධිකාරියක් පිහිටුවනු ලැබිය යුතු ය.

(2) අධිකාරිය, (1) වන උපවගන්තිය මගින් එයට දී ඇති නාමයෙන් සංස්ථාගත මණ්ඩලයක් විය යුතු අතර, ඊට අවිච්ඡින්න පැවැත්මක් සහ පොදු මුද්‍රාවක් තිබිය යුතු ය. තවද, අධිකාරියේ සංස්ථාගත නාමයෙන් එය විසින් ද, එයට එරෙහිව ද නඩු පවරනු ලැබිය හැකි ය.

අධිකාරියේ අරමුණ

**7.** අධිකාරියේ අරමුණ, මේ පනතේ විධිවිධානවලට අනුකූලව, චංචල දේපළ පිළිබඳ සුරක්ෂිතලත් ගනුදෙනු විධිමත් කිරීම සඳහා පහසුකම් සැලසීම සහ ඊට සහභාගී වීම මගින් ජාතික ආර්ථිකයේ යහපත ප්‍රවර්ධනය කිරීම විය යුතු ය.

අධිකාරියේ කාර්ය සහ කර්තව්‍ය

**8.** අධිකාරියේ කාර්ය සහ කර්තව්‍ය -

(අ) මේ පනතේ VI වන කොටස යටතේ චංචල දේපළවල සුරකුු අයිතිවාසිකම් ලියාපදිංචි කිරීම;

(ආ) විනිශ්චිත ණය හිමියන්ගේ අයිතිවාසිකම් ලියාපදිංචි කිරීම;

(ඇ) කාර්යාංශය විසින් පවත්වාගෙන යනු ලබන ලියාපදිංචි කිරීමේ වැඩපිළිවෙළට අදාළ ප්‍රතිපත්ති තීරණය කිරීම;

(ඇ) මේ පනතේ විධිවිධානවලට යටත්ව, අධිකාරිය විසින් සලසනු ලබන සේවා සඳහා අය කළ යුතු ගාස්තු හෝ වෙනත් අය කිරීම් තීරණය කිරීම; සහ

(ඉ) මේ පනත මඟින් හෝ එය යටතේ අධිකාරිය වෙත විශේෂයෙන් පනවන ලද කාර්ය සහ කර්තව්‍ය ඉටු කිරීම සහ කිරීම,

විය යුතු ය.

අධිකාරියේ බලතල

**9.** අධිකාරිය විසින්, ස්වකීය අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා සහ මේ පනතේ 8 වන වගන්තිය මඟින් ඊට පවරා දී ඇති කාර්ය සහ කර්තව්‍ය ඵලදායී ලෙස ඉටු කිරීම සහ කිරීම සඳහා අවශ්‍ය විය හැකි හෝ උචිත වන බලතල ක්‍රියාත්මක කළ යුතු ය.

අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලය

**10.** (1) අධිකාරියේ කටයුතු පරිපාලනය හා කළමනාකරණය, පහත දැක්වෙන සාමාජිකයන්ගෙන් සමන්විත වන, (මේ පනතේ "මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන) අධ්‍යක්ෂ මණ්ඩලයක් වෙත පවරනු ලැබිය යුතු යː-

(අ) මණ්ඩලයේ සභාපතිවරයා විය යුතු, ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපතිවරයා හෝ ඔහු විසින් ඔහුගේ නියෝජිතයා ලෙස නම් කරනු ලබන තැනැත්තකු;

(ආ) භාණ්ඩාගාරයේ ලේකම්වරයා හෝ ඔහු විසින් ඔහුගේ නියෝජිතයා ලෙස නම් කරනු ලබන තැනැත්තකු;

(ඇ) කාර්යාංශයේ සභාපතිවරයා සහ අධ්‍යක්ෂවරයකු හෝ ඔවුන් විසින් ඔවුන්ගේ නියෝජිතයන් ලෙස නම් කරනු ලබන තැනැත්තන්; සහ

(ඈ) මේ පනතේ 16 වන වගන්තිය යටතේ පත් කරනු ලබන, අධිකාරියේ රෙජිස්ට්‍රාර්වරයා.

(2) මණ්ඩලය විසින්, අධිකාරියේ කටයුතු පරිපාලනය කිරීමේ සහ කළමනාකරණය කිරීමේ කාර්යය සඳහා, මේ පනත මඟින් අධිකාරිය වෙත පවරනු ලැබ ඇති, භාර කරනු ලැබ ඇති හෝ

පනවනු ලැබ ඇති බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, ඉටු කිරිම සහ කිරීම කළ යුතු ය.

(3 අධිකාරියේ රෙජිස්ට්‍රාර්වරයා මණ්ඩලයේ ලේකම්වරයා විය යුතු අතර, මණ්ඩලයේ සියලු රැස්වීම්වල සටහන් පිළිබඳ වාර්තාවක් පවත්වාගෙන යාම සඳහා රෙජිස්ට්‍රාර්වරයා වගකිව යුතු ය.

**11.** (1) මණ්ඩලය සෑම කාර්තුවක ම අවම වශයෙන් එක් වරක්වත් රැස්විය යුතු අතර, සභාපතිවරයා මණ්ඩලයේ සෑම රැස්වීමක ම මුලසුන දැරිය යුතු ය. මණ්ඩලයේ යම් රැස්වීමකට සභාපතිවරයා පැමිණ නොසිටී නම්, පැමිණ සිටින සාමාජිකයන් විසින් එම රැස්වීමේ මුලසුන දැරීම සඳහා ඔවුන් අතරින් එක් සාමාජිකයකු තෝරා පත්කර ගත යුතු ය.

මණ්ඩලයේ රැස්වීම්

(2) මණ්ඩලයේ යම් රැස්වීමක් සඳහා ගණපූරණය සාමාජිකයන් තිදෙනෙකු විය යුතු අතර, මණ්ඩලය විසින් මණ්ඩලයේ රැස්වීම් පැවැත්වීම සම්බන්ධයෙන් සහ එම රැස්වීම්වල කටයුතු කරගෙන යාම සම්බන්ධයෙන් වූ කාර්යපටිපාටිය විධිමත් කරනු ලැබිය යුතු ය.

(3) මණ්ඩලයේ යම් රැස්වීමක දී තීරණය කළ යුතු සියලු ප්‍රශ්න එම රැස්වීමට පැමිණ සිටින සාමාජිකයන්ගේ බහුතර ඡන්දයෙන් තීරණය කරනු ලැබිය යුතු ය. ඡන්ද සංඛ්‍යාව සමාන වන අවස්ථාවක දී සභාපතිවරයාට හෝ ඒ රැස්වීමේ මුලසුන දරන සාමාජිකයාට ස්වකීය ඡන්දයට අතිරේකව, තීරක ඡන්දයක් තිබිය යුතු ය.

(4) මණ්ඩලයේ සාමාජිකයන්ගේ යම් පුරප්පාඩුවක් තිබීමේ හෝ මණ්ඩලයේ සාමාජිකයකු නියෝජනය කිරීමට නම් කරන ලද යම් තැනැත්තකු නම් කිරීමේ දී යම් දෝෂයක් තිබීමේ හෝ හේතුව නිසාම පමණක් මණ්ඩලයේ යම් ක්‍රියාවක්, කටයුත්තක් හෝ තීරණයක් බල රහිත නොවිය යුතු ය.

**12.** (1) අධිකාරියේ මුද්‍රාව මණ්ඩලය විසින් තීරණය කරනු ලබන පරිදි විය යුතු අතර, එය මණ්ඩලය විසින් තීරණය කරනු ලබන ආකාරයට වෙනස් කරනු ලැබිය හැකි ය.

අධිකාරියේ මුද්‍රාව

(2) අධිකාරියේ මුද්‍රාව මණ්ඩලයේ ලේකම්වරයාගේ භාරයේ තැබිය යුතු ය.

(3) අධිකාරියේ මුද්‍රාව මණ්ඩලයේ අනුමතය ඇතිව මිස සහ මණ්ඩලයේ සභාපතිවරයා සහ මණ්ඩලයේ තවත් එක් සාමාජිකයකු ඉදිරිපිට දී හැර කිසිදු සාධන පත්‍රයකට හෝ ලේඛනයකට නොතැබිය යුතු අතර, තමන් පැමිණ සිටි බවට සලකුණක් වශයෙන් ඔවුන් දෙදෙනා ඒ සාධන පත්‍රයට හෝ ලේඛනයට අත්සන් තැබිය යුතු ය.

(4) අධිකාරියේ මුද්‍රාව තබනු ලබන සියලු සාධන පත්‍ර සහ ලේඛන පිළිබඳ රෙජිස්ටරයක් මණ්ඩලයේ ලේකම්වරයා විසින් පවත්වාගෙන යා යුතු ය.

**අධිකාරියේ අරමුදල**

**13.** (1) අධිකාරියට ඊටම අයත් අරමුදලක් තිබිය යුතු ය.

(2) අධිකාරියේ අරමුදලට පහත දැක්වෙන මුදල් බැර කරනු ලැබිය යුතු යඃ-

(අ) අධිකාරියේ ප්‍රයෝජනය සඳහා පාර්ලිමේන්තුව විසින් කලින් කල වෙන් කර දෙනු ලබන සියලු මුදල්;

(ආ) අධිකාරිය විසින් සලසනු ලබන සේවා සම්බන්ධයෙන් පනවනු ලබන ගාස්තු හෝ අය කිරීම් ලෙස ලැබෙන සියලු මුදල්; සහ

(ඇ) කවර හෝ මූලාශ්‍රයකින් ණය, පරිත්‍යාග, ත්‍යාග සහ ප්‍රදාන වශයෙන් අධිකාරිය වෙත ලැබෙන සියලු මුදල්.

(3) මේ පනත යටතේ, ස්වකීය බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී, ඉටු කිරීමේ දී සහ කිරීමේ දී අධිකාරිය විසින් දරනු ලබන සියලු වියදම් පියවීම සඳහා අවශ්‍ය සියලු මුදල් අධිකාරියේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

**මුදල් වර්ෂය සහ ගිණුම් විගණනය**

**14.** (1) අධිකාරියේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය.

(2) අධිකාරියේ ආදායම සහ වියදම, වත්කම් හා බැරකම් සහ වෙනත් සියලු මූල්‍ය ගනුදෙනු පිළිබඳව නිසි ගිණුම් පොත් පවත්වාගෙන යාමට මණ්ඩලය කටයුතු සැලැස්විය යුතු ය.

(3) රාජ්‍ය සංස්ථාවල ගිණුම් විගණනය කිරීම සම්බන්ධයෙන් වූ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාවේ විධිවිධාන අධිකාරියේ ගිණුම් විගණනය කිරීම සඳහා සහ ඒ සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

1971 අංක 38 දරන මුදල් පනතේ II වන කොටස අදාළ වීම

**15.** අධිකාරියේ මූල්‍ය පාලනය සහ ගිණුම් පවත්වාගෙන යාම සඳහා සහ ඒ සම්බන්ධයෙන් 1971 අංක 38 දරන මුදල් පනතේ II වන කොටසේ විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව අදාළ විය යුතු ය.

රෙජිස්ට්‍රාර්වරයා

**16.** (1) මණ්ඩලය විසින්, මේ පනතේ කාර්ය සඳහා, අමාත්‍යවරයාගේ අනුමතය ඇතිව, නියමිත සුදුසුකම්ලත් තැනැත්තකු (මේ පනතේ “රෙජිස්ට්‍රාර්වරයා” යනුවෙන් සඳහන් කරනු ලබන) අධිකාරියේ රෙජිස්ට්‍රාර්වරයා ලෙස පත් කරනු ලැබිය යුතු අතර, ඔහු අධිකාරියේ ප්‍රධාන විධායක නිලධරයා විය යුතු ය.

(2) රෙජිස්ට්‍රාර්වරයා, මේ පනත යටතේ සිදු කිරීමට නියම කොට ඇති ලියාපදිංචි කිරීම් හා සම්බන්ධ සියලු කාරණාවල සාමාන්‍ය අධීක්ෂණය සඳහා ද මේ පනත මඟින් හෝ මේ පනත යටතේ රෙජිස්ට්‍රාර්වරයා වෙත පවරා ඇති සියලු බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, ඉටු කිරීම සහ කිරීම සඳහා ද වගකිව යුතු ය. අධිකාරියේ නිලධරයන්ගේ සහ සේවා නියුක්තයන්ගේ පරිපාලනය සම්බන්ධයෙන් ද ඔහු වගකිව යුතු ය.

(3) මේ පනත මඟින් හෝ මේ පනත යටතේ රෙජිස්ට්‍රාර්වරයා වෙත පවරා ඇති යම් බලයක්, කාර්යයක් හෝ කර්තව්‍යයක් ක්‍රියාත්මක කිරීමේ දී, ඉටු කිරීමේ දී හෝ කිරීමේ දී රෙජිස්ට්‍රාර්වරයා විසින් සද්භාවයෙන් කරන ලද කිසිවක් සඳහා ඔහු වගකීමට යටත් නොවිය යුතු ය.

(4) මණ්ඩලය විසින්, අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව සහ තත්කාර්ය සඳහා හේතු දක්වා, (1) වන උපවගන්තිය යටතේ පත් කරන ලද රෙජිස්ට්‍රාර්වරයා ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය.

(5) මේ පනත මඟින් හෝ මේ පනත යටතේ රෙජිස්ට්‍රාර්වරයා වෙත පවරනු ලැබ ඇති යම් බලයක්, කාර්යයක් හෝ කර්තව්‍යයක් අධිකාරියේ යම් නිලධරයකු වෙත පැවරීම අවශ්‍ය යයි රෙජිස්ට්‍රාර්වරයා සලකන යම් අවස්ථාවක දී, මණ්ඩලයේ ලිඛිත අනුමතය ඇතිව, ඔහු විසින් ඒ බලය, කාර්යය හෝ කර්තව්‍යය

එසේ ලිඛිතව පවරා දෙනු ලැබිය හැකි අතර, ඒ නිලධරයා විසින් රෙජිස්ට්‍රාර්වරයාගේ සාමාන්‍ය හෝ විශේෂ විධානයට සහ පාලනයට යටත්ව ඒ බලය, කාර්යය හෝ කර්තව්‍යය ක්‍රියාත්මක කිරීම, ඉටු කිරීම හෝ කිරීම කළ යුතු ය.

අධිකාරියේ කාර්ය මණ්ඩලය

**17.** (1) මේ පනත මගින් හෝ මේ පනත යටතේ අධිකාරිය වෙත පවරා දෙනු ලැබිය හැකි බලතල, කාර්ය සහ කර්තව්‍ය කාර්යක්ෂම ලෙස ක්‍රියාත්මක කිරීම, ඉටු කිරීම සහ කිරීම සඳහා අවශ්‍ය යයි අධිකාරිය විසින් සලකනු ලබන්නා වූ නිලධරයන් සහ සේවානියුක්තයන් අධිකාරිය විසින් පත් කරනු ලැබිය හැකි ය.

(2) අධිකාරියේ ඉල්ලීම පරිදි, රාජ්‍ය සේවයේ යම් නිලධරයකු එම නිලධරයාගේ සහ එම නිලධරයා සේවයේ නියුක්තව සිටින අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ සහ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කැමැත්ත ඇතිව, අධිකාරිය විසින් තීරණය කරනු ලබන කාලසීමාවක් සඳහා අධිකාරියේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබිය හැකි ය. නැතහොත්, එවැනි ම කැමැත්ත ඇතිව එම කාර්ය මණ්ඩලයට ස්ථිරවම පත් කරනු ලැබිය හැකි ය.

(3) රාජ්‍ය සේවයේ යම් නිලධරයකු අධිකාරියේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලබන අවස්ථාවක දී, 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ 14(2) වගන්තියේ විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව එම නිලධරයාට සහ එම නිලධරයා සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(4) රාජ්‍ය සේවයේ යම් නිලධරයකු අධිකාරියේ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලබන අවස්ථාවක දී, 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ 14(3) වගන්තියේ විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව එම නිලධරයාට සහ එම නිලධරයා සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(5) නිශ්චිත කාලසීමාවක් ආණ්ඩුවට සේවය කිරීමට ගිවිසගෙන තිබෙන යම් තැනැත්තකු අධිකාරිය විසින් සේවයේ යොදවා ගනු ලබන අවස්ථාවක දී, ඒ තැනැත්තා විසින් අධිකාරියට සේවය කරනු ලබන යම් කාලසීමාවක්, ඒ ගිවිසුම යටතේ ඒ තැනැත්තාගේ බැඳීම් ඉටු කිරීමේ කාර්යය සඳහා ආණ්ඩුවට කරනු ලබන සේවයක් ලෙස සලකනු ලැබිය යුතු ය.

(6) අධිකාරියේ ඉල්ලීම පරිදි, පළාත් රාජ්‍ය සේවයේ යම් නිලධරයකු, එම නිලධරයාගේ සහ අදාළ පළාත් රාජ්‍ය සේවා

කොමිෂන් සභාවේ කැමැත්ත ඇතිව, අධිකාරිය විසින් තීරණය කරනු ලබන කාලසීමාවක් සඳහා අධිකාරියේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබිය හැකි ය. නැතහොත්, එවැනිම කැමැත්ත ඇතිව එම කාර්ය මණ්ඩලයට ස්ථිරවම පත් කරනු ලැබිය හැකි ය.

අධිකාරියේ රෙජිස්ට්‍රාර්වරයාට සහ නිලධරයන්ට සහ සේවා නියුක්තයන්ට ගෙවිය යුතු පාරිශ්‍රමික

**18.** මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන ආකාරයට සහ එසේ නිශ්චය කරනු ලබන අනුප්‍රමාණ අනුව පාරිශ්‍රමික හා වෙනත් දීමනා අධිකාරියේ රෙජිස්ට්‍රාර්වරයාට සහ වෙනත් සියලු නිලධරයන්ට සහ සේවානියුක්තයන්ට ගෙවනු ලැබිය යුතු අතර, තත්කාර්ය සඳහා සාදනු ලබන රීති මඟින් මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන සේවය පිළිබඳ නියමවලට හා කොන්දේසිවලට ඒ රෙජිස්ට්‍රාර්වරයා, නිලධරයන් සහ සේවා නියුක්තයන් යටත් විය යුතු ය.

## III වන කොටස

## සුරකූ අයිතිවාසිකම් ඇති වීම සහ පාර්ශ්වයන්ගේ අයිතිවාසිකම්

ගිවිසුම් පිළිබඳ නිදහස

**19.** (1) මේ පනතේ හෝ වෙනත් යම් නීතියක අන්‍යාකාරයෙන් විධිවිධාන සලසා ඇත්නම් හැර, සුරකූ ගිවිසුමක් එම ගිවිසුමේ පාර්ශ්වයන් අතර වූ නියමවලට අනුකූලව සහ තුන්වන පාර්ශ්වයකට එරෙහිව බලාත්මක විය යුතු ය.

(2) සුරකූ ගිවිසුමෙහි ලාභ පිළිබඳව විස්තරයක් ඇතුළත් වුව ද නොවූව ද, එය නොතකා ලාභ සම්බන්ධයෙන් වූ පරිපූර්ණත්වයට පත් වූ සුරකූ අයිතිවාසිකමක් තුන්වන පාර්ශ්වයකට එරෙහිව බලාත්මක කරනු ලැබිය හැකි ය.

(3) සුරකූ ගිවිසුමක් ලිඛිතව ඇති අවස්ථාවක, එම ගිවිසුම ලියා අත්සන් කරන ලද දින සිට දින දහයක් ඇතුළත එම ලිඛිත ගිවිසුමේ පිටපතක් සුරක්ෂිතලත් පාර්ශ්වය විසින් ණයකරු වෙත භාරදිය යුතු අතර, ණයකරු විසින් ඉල්ලීමක් කිරීමෙන් පසු එහි පිටපතක් භාර දීම සුරක්ෂිතලත් පාර්ශ්වය පැහැර හරින්නේ නම්, ණයකරු විසින් ඒ සම්බන්ධයෙන් කරන ලද අයදුමක් මත, එහි පිටපතක් ණයකරුට භාර දෙන ලෙසට නියෝගයක් කිරීමට මහෙස්ත්‍රාත් අධිකරණයකට බලය තිබිය යුතු ය.

**සුරකුු අයිතිවාසිකමක් ඇති වීම**

**20.** (1) (අ) වටිනාකම ලබා දුන් විට;

(ආ) ණයකරු සතුව සමපාර්ශ්වීය ද්‍රව්‍ය පිළිබඳ අයිතිවාසිකම් පවතින විට හෝ සමපාර්ශ්වීය ද්‍රව්‍ය පිළිබඳ අයිතිවාසිකම් තුන්වන පාර්ශ්වයකට පැවරීමේ බලය පවතින විට; සහ

(ඇ) (i) සමපාර්ශ්වීය ද්‍රව්‍ය හඳුනා ගැනීමට හැකිවනු පිණිස ප්‍රමාණවත්, ඒ සමපාර්ශ්වීය ද්‍රව්‍ය පිළිබඳ විස්තරයක් ඇතුළත් ගිවිසුමක් ණයකරු අත්සන් කර තිබෙන විට; හෝ

(ii) සමපාර්ශ්වීය ද්‍රව්‍ය සුරක්ෂිතලත් පාර්ශ්වයේ සන්තකයේ හෝ සුරක්ෂිතලත් පාර්ශ්වය වෙනුවෙන් වෙනත් යම් තැනැත්තකු සන්තකයේ පවතින විට,

චල ඍණ භාරයක ස්වභාවයෙන් යුත් සුරකුු අයිතිවාසිකමක් ද ඇතුළත් වන සුරකුු අයිතිවාසිකමක් බද්ධ වන්නේ ය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධාන කවරක් වුව ද, සුරකුු ගිවිසුමේ පාර්ශ්වයන් විසින් සුරකුු අයිතිවාසිකම ඇති වන වේලාව කල් දැමීමට විශේෂයෙන් එකඟ වී ඇති අවස්ථාවක, ඒ එකඟ වූ වේලාවේ දී සුරකුු අයිතිවාසිකම බද්ධ විය යුතු ය.

(3) සුරකුු අයිතිවාසිකමක් (1) වන උපවගන්තියේ විධිවිධාන සලස්වා ඇති ආකාරයට ඇති වී ඇත්නම් මිස, ඒ සුරකුු අයිතිවාසිකම තුන්වන පාර්ශ්වයකට එරෙහිව බලාත්මක කළ නොහැකි විය යුතු ය.

**ගිවිසුමෙන් පසුව අත්කර ගත් චංචල දේපළවල සුරක්ෂිත බව**

**21.** (1) (2) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, සුරකුු ගිවිසුමක් මඟින් ඒ ගිවිසුමට ඇතුළත් වීමෙන් පසුව අත්කර ගනු ලබන යම් දේපළක් ද ආවරණය කරනු ලැබිය හැකි ය:

එසේ වුව ද, ගිවිසුමකට ඇතුළත් වීමෙන් පසුව අත්කර ගත් දේපළ හා සම්බන්ධ සුරකුු අයිතිවාසිකමක්, ණයකරු එම දේපළ කෙරෙහි අයිතිවාසිකමක් අත්කර ගන්නා තෙක්, බලාත්මක කළ හැකි සුරකුු අයිතිවාසිකමක් බවට පත් නොවන්නේ ය.

(2) සුරකු ගිවිසුමක අන්තර්ගත ඒ සුරකු ගිවිසුමට ඇතුළත් වීමෙන් පසුව අත්කර ගත් යම් දේපළක් ආවරණය කරන වගන්තියක් යටතේ -

(අ) අවස්ථාවෝචිත පරිදි, නිශ්චල දේපළ පිළිබඳ බද්දක, මිල දී ගැනීමක හෝ උකසක කාලය තුළ ඒ දේපළේ වවන ලද බෝග සම්බන්ධයෙන්, ඒ බද්ද, මිල දී ගැනීම හෝ උකස සමඟ දෙනු ලබන බෝග සම්බන්ධයෙන් වූ සුරකු අයිතිවාසිකමක් ඇතිකර ගැනීමට එකඟ වූයේ නම් එසේ ඇතිකර ගැනීමට හැකි වීම හැර, සුරකු ගිවිසුමකට ඇතුළත් වීමෙන් අවුරුදු එකකට පසුව වගා කරන බෝග සම්බන්ධයෙන්; හෝ

(ආ) (i) සුරක්ෂිතලත් පාර්ශ්වය විසින් වටිනාකම ලබා දුන් දින සිට දින දහයක් ඇතුළත ණයකරු අයිතිවාසිකම් අත්කර ගන්නේ නම් මිස; හෝ

(ii) පාරිභෝගික නොවන ගනුදෙනුවක් සඳහා පෞද්ගලික ඇපකරයක් සුරක්ෂිත කිරීමට ණයකරු විසින් තම පෞද්ගලික වත්කම් සම්බන්ධයෙන් සුරකු අයිතිවාසිකමක් ප්‍රදානය කරන්නේ නම් මිස,

එක් කිරීම් හැර, වෙනත් පාරිභෝගික භාණ්ඩ සම්බන්ධයෙන්,

සුරකු අයිතිවාසිකමක් ඇති කරනු නො ලැබිය යුතු ය.

අනාගත අත්තිකාරම්

**22.** අනාගත අත්තිකාරම් වශයෙන් ලබා දිය හැකි උපරිම මුදල සුරකු ගිවිසුමේ නිශ්චිතව දක්වා ඇත්නම්, අනාගත අත්තිකාරම් සුරක්ෂිත කිරීම සඳහා වන විධිවිධානයක් සුරකු ගිවිසුමක ඇතුළත් කරනු ලැබිය හැකි ය.

ගිවිසුමක් මඟින් පැවරුම්ලාභියකුට එරෙහිව විත්තිවාචක තහවුරු කළ නොහැකි බව

**23.** (82 වන අධිකාරය වූ) විනිමය බිල්පත් ආඥාපනත යටතේ ගනුදෙනු කළ හැකි සාධන පත්‍රයක යථා කාල ධාරකයාට එරෙහිව තහවුරු කළ හැකි යම් විත්තිවාචක හැර, ණයකරුවකුගේ විකුණුම්කරුට හෝ බදු දීමනාකරුට එරෙහිව ඒ ණයකරුට ඇති යම් හිමිකම්පෑමක් හෝ විත්තිවාචකයක් පැවරුම්ලාභියකුට එරෙහිව තහවුරු නොකිරීම සඳහා ණයකරු විසින් ඇති කරගනු ලබන ගිවිසුමක්, සද්භාවයෙන් යුතුව සහ දැන්වීමක් නොමැතිව වටිනාකමක් සඳහා එම පැවරුම ලබා ගන්නා පැවරුම්ලාභියකු විසින් බලාත්මක කරනු ලැබිය හැකි ය.

භාණ්ඩ විකිණීමේ ආඥාපනත අදාළ වීම

**24.** විකුණන ලද යම් භාණ්ඩ කිසිවක් සම්බන්ධයෙන් අත්කර ගැනීමේ සුරකු අයිතිවාසිකමක් විකුණුම්කරුවකු විසින් රඳවා තබා ගන්නා අවස්ථාවක  දී -

(අ) (84 වන අධිකාරය වූ) භාණ්ඩ විකිණීමේ ආඥාපනත ඇතුළු විකුණුම් ගිවිසුම් හා සම්බන්ධ නීතිය මඟින් අදාළ විකිණීම සහ ඒ විකුණුම්කරුගේ යම් කොන්දේසි සහ ප්‍රතිඥාහාර අත්හැරීම, සීමා කිරීම හෝ වෙනස් කිරීම පාලනය විය යුතු ය; තව ද,

(ආ) 23 වන වගන්තියේ විධිවිධාන සලසා ඇති පරිදි හැර, විකුණුම් ගිවිසුමක ඇති කොන්දේසිවලට සහ ප්‍රතිඥාහාරවලට යම් සුරකු ගිවිසුමක් මඟින් බලපෑමක් සිදු නොවිය යුතු ය.

කඩිනම් කිරීමේ වගන්ති

**25.** සමපාර්ශ්වීය ද්‍රව්‍ය අන්තරායකට භාජනය වනු ඇතැයි හෝ සුරක්ෂිතලත් පාර්ශ්වය අනාරක්ෂිත යයි එම සුරක්ෂිතලත් පාර්ශ්වය සලකනු ලබන විටෙක, ඒ සුරක්ෂිතලත් පාර්ශ්වය විසින් ගෙවීම හෝ ඉටු කිරීම කඩිනම් කර ගනු පිණිස කටයුතු කිරීමට සුරකු ගිවිසුමක් මඟින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ගෙවීමේ හෝ ඉටු කිරීමේ ඉඩ ප්‍රස්ථාවලට බාධා සිදු වනු ඇති බවට හෝ බාධා සිදු වීමට අත්‍යාසන්න බවට නැතහොත් සමපාර්ශ්වීය ද්‍රව්‍ය අන්තරායකට භාජනය වනු ඇති බවට හෝ එසේ වීමට අත්‍යාසන්න බවට ඒ සුරක්ෂිතලත් පාර්ශ්වය සද්භාවයෙන් විශ්වාස කරන්නේ නම් සහ විශ්වාස කිරීමට සාධාරණ හේතු ඇත්නම් පමණක් එසේ කඩිනම් කර ගැනීමට කටයුතු කිරීමට ඒ සුරක්ෂිතලත් පාර්ශ්වයට අයිතිවාසිකම ඇත්තේ ය යන අදහසින් එම සුරකු ගිවිසුම තේරුම් ගනු ලැබිය යුතු ය.

සුරක්ෂිතලත් පාර්ශ්වයක් විසින් සමපාර්ශ්වීය ද්‍රව්‍යවල භාරකාරත්වය දැරීම සහ ඒවා ආරක්ෂා කිරීම

**26.** (1) සුරක්ෂිතලත් පාර්ශ්වයක සන්තකයේ ඇති සමපාර්ශ්වීය ද්‍රව්‍යවල භාරකාරත්වය පිළිබඳව සහ ඒවා ආරක්ෂා කිරීම පිළිබඳව ඒ සුරක්ෂිතලත් පාර්ශ්වය විසින් සාධාරණ සැලකිල්ලක් දැක්විය යුතු අතර, අන්‍යාකාරයකට එකඟ වූයේ නම් මිස, පුද්ගලික දේපළ පත්‍රයක් හෝ සාධන පත්‍රයක් සම්බන්ධයෙන් වන විට සාධාරණ සැලකිල්ල යන්නට පූර්ව පාර්ශ්වයන්ට එරෙහිව අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට අවශ්‍ය පියවර ගැනීම ද ඇතුළත් විය යුතු ය.

(2) අන්‍යාකාරයකට එකඟ වූයේ නම් මිස, සමපාර්ශ්වීය ද්‍රව්‍යයක් සුරක්ෂිතලත් පාර්ශ්වයක සන්තකයේ ඇත්නම් -

(අ) රක්ෂණ පිරිවැය සහ බදු ගෙවීම් හෝ සමපාර්ශ්වීය ද්‍රව්‍යවල සන්තකය ලබා ගැනීමේ දී සහ එහි සන්තකය පවත්වාගෙන යාමේ දී සහ එය ආරක්ෂා කිරීමේ දී දරන ලද වෙනත් ගාස්තු ඇතුළු සාධාරණ වියදම් ණයකරුගෙන් අයකර ගනු ලැබිය යුතු අතර ඒ වියදම් සමපාර්ශ්වීය ද්‍රව්‍ය මඟින් සුරක්ෂිත කරනු ලැබිය යුතු ය;

(ආ) සුරක්ෂිතලත් පාර්ශ්වයේ නොසැලකිල්ල හේතු කොට ගෙන සිදු වූයේ නම් මිස, යම් අවදානමක්, පාඩුවක් හෝ අලාභයක් යම් රක්ෂණ ආවරණයක ඇති යම් ඌනතාවයක ප්‍රමාණයට ණයකරු විසින් දැරිය යුතු ය;

(ඇ) සමපාර්ශ්වීය ද්‍රව්‍යයෙන් ලැබුණු මුදල් හැර, යම් වැඩිවීමක් හෝ ලාභයක් සුරක්ෂිතලත් පාර්ශ්වය විසින් අතිරේක සුරැකුමක් ලෙස දැරිය හැකි අතර, එසේ ලැබුණු යම් මුදලක් ණයකරුට ප්‍රේෂණය කරනු ලබන්නේ නම් මිස, සුරක්ෂිත කරන ලද වගකීම අඩු කිරීම සඳහා වහාම යොදා ගනු ලැබිය යුතු ය; සහ

(ඇ) සුරක්ෂිතලත් පාර්ශ්වය විසින් සමපාර්ශ්වීය ද්‍රව්‍ය හඳුනාගත හැකි ආකාරයට තබා ගත යුතු ය; කෙසේ වුව ද, සමජාතීය සමපාර්ශ්වීය ද්‍රව්‍ය සම්මිශ්‍ර කොට තබා ගනු ලැබිය හැකි ය.

(3) (අ) (1) වන උපවගන්තිය හෝ (2) වන උපවගන්තිය මඟින් පනවා ඇති යම් බැඳීමක් ඉටු කිරීම සුරක්ෂිතලත් පාර්ශ්වයක් විසින් පැහැර හැරීම හේතු කොටගෙන සිදු වූ යම් පාඩුවක් හෝ අලාභයක් සඳහා එම සුරක්ෂිතලත් පාර්ශ්වය වගකීමට යටත් විය යුතු නමුත්, ඒ හේතුවෙන් එම සමපාර්ශ්වීය ද්‍රව්‍ය පිළිබඳ සුරකු අයිතිවාසිකම සුරක්ෂිතලත් පාර්ශ්වයට අහිමි නො විය යුතු ය; තව ද,

(ආ) සුරක්ෂිතලත් පාර්ශ්වයක් විසින් (4) වන උපවගන්තිය මඟින් බලය දී ඇති පරිදි හැර අන්‍යාකාරයෙන් සමපාර්ශ්වීය ද්‍රව්‍ය භාවිත කිරීම හේතු කොටගෙන සිදු වූ යම් පාඩුවක් හෝ අලාභයක් සඳහා එම සුරක්ෂිතලත් පාර්ශ්වය වගකීමට යටත් විය යුතු ය.

(4) සුරක්ෂිතලත් පාර්ශ්වයකට -

(අ) සුරකු ගිවිසුමේ විධිවිධාන සලසා ඇති ආකාරයට සහ ප්‍රමාණයට;

(ආ) සමපාර්ශ්වීය ද්‍රව්‍ය හෝ ඒවායේ වටිනාකම ආරක්ෂා කිරීමේ කාර්යය සඳහා; හෝ

(ඇ) අධිකරණයක් විසින් කරන ලද ආඥාවකට අනුකූලව,

සමපාර්ශ්වීය ද්‍රව්‍ය භාවිත කළ හැකි ය.

සුරකු ගිවිසුම පිළිබඳව තොරතුරු ලබා ගැනීම

**27.** (1) ණයකරු හෝ ණයකරුගේ බලයලත් නියෝජිතයකු විසින් සුරක්ෂිතලත් පාර්ශ්වය වෙත දෙනු ලබන ලිඛිත දැන්වීමක් මඟින් -

(අ) ඒ දැන්වීමේ නිශ්චිතව දැක්වෙන දිනයට ඇති ණයගැති භාවයේ ප්‍රමාණය හා ඒ ණය ගෙවීමේ කොන්දේසි පිළිබඳ ලිඛිත ප්‍රකාශයක්;

(ආ) ඒ දැන්වීමට අමුණා ඇති ලැයිස්තුවක නිශ්චිතව දක්වා ඇති පරිදි, ඒ දැන්වීමේ නිශ්චිතව දැක්වෙන දිනයට ඇති සමපාර්ශ්වීය ද්‍රව්‍ය හෝ එහි කොටසක් පිළිබඳව වන, ප්‍රකාශයක් අනුමත කරමින් හෝ නිවැරදි කරමින් කරනු ලබන ලිඛිත ප්‍රකාශයක්;

(ඇ) ඒ දැන්වීමේ නිශ්චිතව දැක්වෙන දිනයට ඇති ණයගැතිභාවයේ ප්‍රමාණය සහ ඒ ණය ගෙවීමේ කොන්දේසි පිළිබඳ ප්‍රකාශයක් අනුමත කරමින් හෝ නිවැරදි කරමින් කරනු ලබන ලිඛිත ප්‍රකාශයක්; හෝ

(ඈ) සුරකුම් ගිවිසුමේ සත්‍ය පිටපතක්,

තමා වෙත ඉදිරිපත් කරන ලෙස ඒ සුරක්ෂිතලත් පාර්ශ්වයට නියම කරනු ලැබිය හැකි ය.

(2) සුරක්ෂිතලත් පාර්ශ්වය, භාර ප්‍රතිඥා පත්‍රයක් යටතේ භාරකරුවා වන අවස්ථාවක (1) වන උපවගන්තියේ විධිවිධාන අදාළ නො විය යුතු ය.

(3) සුරක්ෂිතලත් පාර්ශ්වය, ණයකරුට අයත් සියලුම සමපාර්ශ්වීය ද්‍රව්‍ය සම්බන්ධයෙන් හෝ යම් විශේෂිත වර්ගයක වූ සියලුම සමපාර්ශ්වීය ද්‍රව්‍ය සම්බන්ධයෙන් සුරකුම් අයිතිවාසිකමක් සඳහා හිමිකම් පාන්නේ නම්, (1) වන උපවගන්තියේ (ආ) ඡේදය යටතේ වූ දැන්වීමට ඇමිණිය යුතු බවට නියමිත ඒ සමපාර්ශ්වීය ද්‍රව්‍ය ලැයිස්තුව අනුමත කිරීම හෝ නිවැරදි කිරීම වෙනුවට සුරක්ෂිතලත් පාර්ශ්වය විසින් ඒ සමපාර්ශ්වීය ද්‍රව්‍ය සම්බන්ධයෙන් එසේ හිමිකම් පාන බව සඳහන් කළ හැකි ය.

(4) (6) වන උපවගන්තිය යටතේ නියමිත යම් ගාස්තුවක් ගෙවීමට යටත්ව, (1) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද දැන්වීමක් සුරක්ෂිතලත් පාර්ශ්වය වෙත ලැබී දින පහළොවක් ඇතුළත ඒ සුරක්ෂිතලත් පාර්ශ්වය විසින් ඒ දැන්වීමට ප්‍රතිචාර දැක්විය යුතු අතර, සුරක්ෂිතලත් පාර්ශ්වය විසින් සාධාරණ හේතුවක් නොමැතිව -

(අ) එම දින පහළොවක කාලසීමාව තුළ එම දැන්වීමට ප්‍රතිචාර දැක්වීම පැහැර හැරියහොත් එම උපවගන්තිය යටතේ තොරතුරු ලබා ගැනීමට හිමිකම ඇති යම් තැනැත්තකුට එමගින් සිදු වන යම් පාඩුවක් හෝ අලාභයක් සඳහා සුරක්ෂිතලත් පාර්ශ්වය වගකීමකට යටත් විය යුතු ය; හෝ

(ආ) අසම්පූර්ණ හෝ වැරදි සහගත යම් ප්‍රතිචාරයක් ලබා දෙන්නේ නම්, එම ප්‍රතිචාරය මත විශ්වාසය තබනු ඇතැයි සාධාරණ ලෙස අපේක්ෂා කරනු ලැබිය හැකි යම් තැනැත්තකුට එමගින් සිදුවන යම් පාඩුවක් හෝ අලාභයක් සඳහා සුරක්ෂිතලත් පාර්ශ්වය වගකීමකට යටත් විය යුතු ය.

(5) (1) වන උපවගන්තිය යටතේ වූ දැන්වීමක් ලබන යම් තැනැත්තකුට එම දැන්වීමට විෂය වන ණයකරුගේ වගකීම හෝ දේපළ පිළිබඳව තවදුරටත් බැඳියාවක් නොමැති අවස්ථාවක, ඒ තැනැත්තා විසින් එම දැන්වීම ලැබී දින පහළොවක් ඇතුළත, ඒ බැඳියාවේ ඊළඟ අනුප්‍රාප්තිකයාගේ නම සහ ලිපිනය ද, දන්නේ නම්, එම බැඳියාවේ අවසාන අනුප්‍රාප්තිකයාගේ නම සහ ලිපිනය ද හෙළිදරව් කළ යුතු ය. සාධාරණ හේතුවක් නොමැතිව එසේ හෙළිදරව් කිරීම ඒ තැනැත්තා පැහැර හැරියහොත් එම ඉල්ලීම කරන තැනැත්තාට මේ පනත මගින් ලබා දිය හැකි වෙනත් යම් ප්‍රතිකර්මයකට අමතරව එම ඉල්ලීමට අනුකූලව කටයුතු කරන ලෙසට ආඥාවක් කරවා ගැනීමට 28 වන වගන්තිය යටතේ අධිකරණය වෙත ඉල්ලීමක් කිරීමට හිමිකම තිබිය යුතු ය.

(6) මේ වගන්තිය යටතේ ඉල්ලීමක් කරනු ලබන්නේ යම් තැනැත්තකුගෙන් ද ඒ තැනැත්තා වෙත කරනු ලබන එක් එක් ඉල්ලීම සම්බන්ධයෙන් යම් නියමිත ගාස්තුවක් කලින් ගෙවන ලෙස නියම කරනු ලැබිය හැකි ය. එසේ වුව ද, සෑම මාස හයකට ම එක් වරක් ගාස්තුවක් නොමැතිව පිළිතුරක් ලබා ගැනීමට ණයකරුවකුට හිමිකම තිබිය යුතු ය.

අනුකූලව කටයුතු කිරීමේ ආඥාවක් නිකුත් කිරීමට අධිකරණය සතු බලය

**28.** (1) තත්කාර්ය සඳහා කරනු ලබන ඉල්ලීමක් මත -

(අ) 27 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ දැන්වීමක් ලබන සුරක්ෂිතලත් පාර්ශ්වය හෝ තැනැත්තා, ඒ දැන්වීම මඟින් කරන ලද ඉල්ලීමට අනුකූලව කටයුතු කළ යුතු යයි නියම කරමින්;

(ආ) 27 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ දෙන ලද දැන්වීමට අනුකූලව කටයුතු කිරීමෙන් සුරක්ෂිතලත් පාර්ශ්වය සම්පූර්ණයෙන් හෝ කොටසකින් නිදහස් කරමින්;

(ඇ) 27 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදය යටතේ නිකුත් කරන ලද දැන්වීමට අනුකූලව කටයුතු කිරීම සඳහා ඉඩ දී ඇති කාලසීමාව දීර්ඝ කරමින්; හෝ

(ඈ) අවස්ථානුගත කරුණු අනුව යුක්තිසහගත යයි අධිකරණය සලකනු ලබන,

ආඥාවක් කිරීමට නිසි අධිකරණ බලය ඇති මහෙස්ත්‍රාත් අධිකරණයකට බලය ඇත්තේ ය.

(2) මහෙස්ත්‍රාත්වරයකු විසින් (1) වන උපවගන්තිය යටතේ කරන ලද ආඥාවකට අනුකූලව කටයුතු කිරීම පැහැර හරින යම් තැනැත්තකු මේ පනත යටතේ වරදක් සිදු කරන අතර, වරදකරු කරනු ලැබීමෙන් පසුව, රුපියල් ලක්ෂ පහකට නොවැඩි දඩයකට හෝ එක් අවුරුද්දක් නොඉක්මවන කාලයක් සඳහා බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම හෝ එම තැනැත්තා යටත් විය යුතු ය.

## IV වන කොටස
## පරිපූර්ණත්වයට පත් වීම

සුරකූ අයිතිවාසිකමක් පරිපූර්ණත්වයට පත් වීම

**29.** (1) මේ පනතේ 4 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව, සුරක්ෂිතලත් පාර්ශ්වය විසින් හෝ සුරක්ෂිතලත් පාර්ශ්වය වෙනුවෙන් වෙනත් යම් තැනැත්තකු විසින් සමපාර්ශ්වීය ද්‍රව්‍යයක සන්තකය දැරීම මඟින්-

(අ) පුද්ගලික දේපළ පත්‍රයක්;

(ආ) භාණ්ඩ;

(ඇ) සාධන පත්‍රයක්;

(ඈ) සහතික කරන ලද සුරැකුමක්; සහ

(ඉ) මුදල්,

හා සම්බන්ධ සුරකූ අයිතිවාසිකමක් පරිපූර්ණත්වයට පත් වන්නේ ය.

(2) මේ පනතේ VI වන කොටස යටතේ සුරකූ අයිතිවාසිකමක් ලියාපදිංචි කිරීම මඟින් ඕනෑම වර්ගයක සමපාර්ශ්වීය ද්‍රව්‍යයක් පරිපූර්ණත්වයට පත් වන්නේ ය.

(3) (1) වන උපවගන්තියේ කාර්ය සඳහා, සමපාර්ශ්වීය ද්‍රව්‍ය සුරක්ෂිතලත් පාර්ශ්වයේ හෝ ඔහුගේ බලයලත් නියෝජිතයාගේ සන්තකයට හෝ භාරකාරත්වයට ඇත්ත වශයෙන් ම පත් කරනු ලැබිය යුතු අතර, ඒ සමපාර්ශ්වීය ද්‍රව්‍ය සම්බන්ධයෙන් තම අයිතිවාසිකම් බලාත්මක කිරීම සඳහා සුරක්ෂිතලත් පාර්ශ්වය කටයුතු කරන තෙක් ඒ සමපාර්ශ්වීය ද්‍රව්‍ය සුරක්ෂිතලත් පාර්ශ්වය සන්තකයේ ඇත්ත වශයෙන් ම, දෘශ්‍යමාන ලෙස සහ සද්භාවයෙන් තබා ගත යුතු ය.

තාවකාලික පරිපූර්ණත්වය

**30.** (1) (අ) (i) විකිණීමේ හෝ හුවමාරු කිරීමේ කාර්යය සඳහා;

(ii) ඉදිරිපත් කිරීමේ, රැස් කිරීමේ හෝ අලුත් කිරීමේ කාර්යය සඳහා; හෝ

(iii) පැවරුමක් ලියාපදිංචි කිරීමේ කාර්යය සඳහා,

සුරක්ෂිතලත් පාර්ශ්වයක් විසින් ණයකරු වෙත භාර දෙන සාධන පත්‍රයක හෝ සහතිකයක සන්තකය දැරීම මගින් පරිපූර්ණත්වයට පත්වන සුරකු අයිතිවාසිකමක්; හෝ

(ආ) (i) විකිණීමේ හෝ හුවමාරු කිරීමේ කාර්යය සඳහා;

(ii) පැටවීමේ, ගොඩබෑමේ, ගබඩා කිරීමේ, නැව්ගත කිරීමේ හෝ නැව්වලට මාරු කිරීමේ කාර්යය සඳහා; හෝ

(iii) භාණ්ඩ විකිණීමට හෝ හුවමාරු කිරීමට පෙර නිෂ්පාදනය කිරීමේ, පිරිසැකසුම් කිරීමේ, ඇසිරීමේ හෝ භාණ්ඩ සම්බන්ධයෙන් වෙනත් යම් ආකාරයකට කටයුතු කිරීමේ කාර්යය සඳහා,

සුරක්ෂිතලත් පාර්ශ්වය විසින් ණයකරු වෙත ලබා දෙන්නා වූ ගනුදෙනු කළ හැකි හිමිකම් ලේඛනයක සන්තකය දැරීම මඟින් හෝ ගනුදෙනු කළ හැකි හිමිකම් ලේඛනයක් මඟින් ආවරණය නොවන උපනිධානලාභියකු විසින් දරා සිටින භාණ්ඩවල සන්තකය දැරීම මඟින් පරිපූර්ණත්වයට පත්වන සුරකු අයිතිවාසිකමක්,

ඒ සමපාර්ශ්වීය ද්‍රව්‍ය ණයකරුගේ පාලනය යටතට පත් වී පළමු දින දහයක කාලසීමාව තුළ පරිපූර්ණත්වයෙන් පැවතිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ සඳහන් දින දහයක කාලසීමාව අවසන් වීමෙන් පසුව අදාළ සුරකු අයිතිවාසිකම, සුරකු අයිතිවාසිකමක් පරිපූර්ණත්වයට පත් වීම සම්බන්ධයෙන් විධිවිධාන සලස්වන මේ පනතේ විධිවිධානවලට යටත් විය යුතු ය.

ලාභ සම්බන්ධයෙන් වන පරිපූර්ණත්වය

**31.** (1) සමපාර්ශ්වීය ද්‍රව්‍ය සම්බන්ධයෙන් කටයුතු කිරීමෙන් ලාභ ඉපදවීමක් සිදු වන අවස්ථාවක -

(අ) සුරකු අයිතිවාසිකමින් නිදහස්ව සමපාර්ශ්වීය ද්‍රව්‍ය සම්බන්ධයෙන් කටයුතු කිරීමට සුරක්ෂිතලත් පාර්ශ්වය ප්‍රකාශිතව හෝ ගම්‍යමාන ලෙස බලය පවරන්නේ නම් මිස, ඒ සමපාර්ශ්වීය ද්‍රව්‍ය සම්බන්ධයෙන් වූ සුරකු අයිතිවාසිකම තවදුරටත් පවතින්නේ ය; තව ද,

(ආ) ඒ ලාභ, සුරකු ගිවිසුම මඟින් ආවරණය කරනු ලැබ නොතිබුණේ වුව ද, ඒ සමපාර්ශ්වීය ද්‍රව්‍ය සම්බන්ධයෙන් වූ සුරකු අයිතිවාසිකම නිරායාසයෙන් ම ඒ ලාභ දක්වා ද ව්‍යාප්ත වන්නේ ය.

(2) සුරක්ෂිතලත් පාර්ශ්වයක් විසින් සමපාර්ශ්වීය ද්‍රව්‍ය සහ ලාභ යන දෙකට ම එරෙහිව සුරකු අයිතිවාසිකමක් බලාත්මක කරන්නේ නම්, සමපාර්ශ්වීය ද්‍රව්‍ය සහ ලාභ පිළිබඳ සුරකු අයිතිවාසිකම මඟින් සුරක්ෂිත කරනු ලබන මුදල, ඒ කටයුතු කිරීම සිදු වූ දිනයේ දී සමපාර්ශ්වීය ද්‍රව්‍යයේ වෙළෙඳපළ වටිනාකමට සීමා විය යුතු ය.

(3) ලාභ උද්ගත වූ අවස්ථාවේ දී සමපාර්ශ්වීය ද්‍රව්‍ය පිළිබඳ බැඳියාව පරිපූර්ණත්වයට පත් වූයේ නම්, ලාභ පිළිබඳ සුරකු අයිතිවාසිකම අඛණ්ඩව පරිපූර්ණත්වයට පත් වූ සුරකු අයිතිවාසිකමක් වන්නේ ය.

(4) ලියාපදිංචි කිරීමෙන් හැර වෙනත් ක්‍රමයකින් මුල් සමපාර්ශ්වීය ද්‍රව්‍යයක් පිළිබඳ සුරකු අයිතිවාසිකමක් පරිපූර්ණත්වයට පත් වන අවස්ථාවක, ලාභ පිළිබඳ සුරකු අයිතිවාසිකම මේ පනත යටතේ පරිපූර්ණත්වයට පත් වුවහොත් මිස, ණයකරු විසින් ලාභ පිළිබඳව යම් බැඳියාවක් අත්කර ගෙන දින දහයකට පසුව ඒ ලාභ පිළිබඳ සුරකු අයිතිවාසිකම අපරිපූර්ණ තත්ත්වයට පත් වන්නේ ය.

උප-නිධානලාභියෙකු විසින් භාණ්ඩ දරන අවස්ථාවක පරිපූර්ණත්වයට පත්වීම

**32.** (1) මේ පනතේ 4 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව, තමා සන්තකයේ ඇති භාණ්ඩ ආවරණය කරමින් ගනුදෙනු කළ හැකි හිමිකම් ලේඛනයක් නිකුත් කර ඇති උපනිධානලාභියකු සන්තකයේ ඇති භාණ්ඩ පිළිබඳ සුරකු අයිතිවාසිකමක්, එම ලේඛනය පිළිබඳ සුරකු අයිතිවාසිකමක් පරිපූර්ණත්වයට පත් කිරීම මඟින් පරිපූර්ණත්වයට පත් කළ යුතු අතර, එසේ ආවරණය කර තිබිය දී අන්‍යාකාරයකින් පරිපූර්ණත්වයට පත් වූ ඒ භාණ්ඩ පිළිබඳ යම් සුරකු අයිතිවාසිකමක්, ඒ ගනුදෙනු කළ හැකි හිමිකම් ලේඛනය පිළිබඳ පරිපූර්ණ වූ සුරකු අයිතිවාසිකමට යටත් විය යුතු ය.

(2) ණයකරු, ණයකරුගේ අනුයෝජිතයකු හෝ (1) වන උපවගන්තියේ සඳහන් උපනිධානලාභියකු හැර, වෙනත් තැනැත්තකු සන්තකයේ පවතින සමපාර්ශ්වීය ද්‍රව්‍ය පිළිබඳ සුරකු අයිතිවාසිකමක් -

(අ) සුරක්ෂිතලත් පාර්ශ්වය නමින් හිමිකම් ලේඛනයක් නිකුත් කිරීම මඟින්;

(ආ) සුරක්ෂිතලත් පාර්ශ්වය වෙනුවෙන් සන්තකය දැරීම මඟින්; හෝ

(ඇ) ලියාපදිංචි කිරීම මඟින්,

පරිපූර්ණත්වයට පත් කරනු ලැබිය හැකි ය.

ආපසු භාරදුන්, තහනමට ගනු ලැබූ හෝ ආපසු සන්තකය ලද භාණ්ඩ පරිපූර්ණත්වයට පත් වීම සහ ඒවා පිළිබඳ ප්‍රමුඛතාව

**33.** (1) ණයකරුවකු විසින්, සුරකු අයිතිවාසිකමකට යටත් භාණ්ඩ විකුණනු ලබන හෝ බදු දෙනු ලබන අවස්ථාවක දී-

(අ) ගැනුම්කරු හෝ බදු ගැනුම්කරු 31 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදය යටතේ හෝ 34 වන වගන්තියේ (1) වන උපවගන්තිය හෝ (2) වන උපවගන්තිය යටතේ සුරකු අයිතිවාසිකමෙන් නිදහස්ව භාණ්ඩ ලබාගෙන ඇත්නම්; සහ

(ආ) සුරක්ෂිත කරන ලද වගකීම නොගෙවා හෝ ඉටු නොකර පවතී නම්,

ඒ සුරකු අයිතිවාසිකම ඒ භාණ්ඩවලට නැවත බද්ධ වන්නේ ය.

(2) (1) වන උපවගන්තියේ සඳහන් අවස්ථානුගත තත්ත්වයන්හි දී භාණ්ඩ පිළිබඳ සුරකු අයිතිවාසිකමක් නැවත බද්ධ වන අවස්ථාවක දී-

(අ) ඒ භාණ්ඩ පිළිබඳ සුරකු අයිතිවාසිකම පරිපූර්ණත්වයට පත්ව තිබේ ද හෝ නැති ද යන්න පිළිබඳ යම් ප්‍රශ්නයක්; සහ

(ආ) එය පරිපූර්ණත්වයට පත් වූ අවස්ථාව හෝ ලියාපදිංචි කළ අවස්ථාව පිළිබඳ යම් ප්‍රශ්නයක්,

ඒ භාණ්ඩ විකුණා හෝ බදු දී හෝ නොතිබුණු ලෙස සලකා තීරණය කරනු ලැබිය යුතු ය.

(3) භාණ්ඩ විකිණීමක් හෝ බදු දීමක් මඟින් ගිණුමක් හෝ පුද්ගලික දේපළ පත්‍රයක් ඇති කරනු ලදුව, ඒ ගිණුම හෝ පුද්ගලික දේපළ පත්‍රය සුරක්ෂිතලත් පාර්ශ්වයකට පවරනු ලබන අවස්ථාවක දී සහ එම භාණ්ඩ විකුණුම්කරු හෝ බදු දීමනාකරු වෙත ආපසු භාර දෙන අවස්ථාවක හෝ විකුණුම්කරු හෝ බදු දීමනාකරු විසින් ඒ භාණ්ඩවල සන්තකය ආපසු ලබන අවස්ථාවක දී ගිණුමේ හෝ පුද්ගලික දේපළ පත්‍රයේ පැවරුම්ලාභියාට එම භාණ්ඩ පිළිබඳව සුරකු අයිතිවාසිකමක් තිබිය යුතු ය.

(4) ගිණුම පිළිබඳ හෝ පුද්ගලික දේපළ පත්‍රය පිළිබඳ සුරකු අයිතිවාසිකම ද පරිපූර්ණ වී තිබුණේ නම්, (3) වන උපවගන්තිය යටතේ උද්ගත වන භාණ්ඩ පිළිබඳ සුරකු අයිතිවාසිකමක් පරිපූර්ණ වන නමුත්, භාණ්ඩ ආපසු භාරදුන් හෝ භාණ්ඩවල සන්තකය ආපසු ලබාගත් දින සිට දින දහයක කාලසීමාවක් ඉකුත් වීමට පෙර පැවරුම්ලාභියා විසින් සුරකු අයිතිවාසිකම සම්බන්ධයෙන් මූල්‍යන ප්‍රකාශයක් ලියාපදිංචි කරන්නේ නම් හෝ භාණ්ඩවල සන්තකය ආපසු ලබා ගන්නේ නම් මිස, භාණ්ඩ ආපසු භාරදුන් හෝ භාණ්ඩවල සන්තකය ආපසු ලබා ගත් දින සිට දින දහයක් ඉකුත්වීමේ දී ඒ භාණ්ඩ පිළිබඳ සුරකු අයිතිවාසිකම අපරිපූර්ණ තත්ත්වයට පත් වන්නේ ය.

(5) ගිණුමක පැවරුම්ලාභියා විසින් (3) වන සහ (4) වන උපවගන්ති යටතේ භාණ්ඩ පිළිබඳ පරිපූර්ණ වූ සුරකු අයිතිවාසිකමක් ලබා ගන්නේ නම්, භාණ්ඩ සම්බන්ධයෙන් පැවරුම්ලාභියාගේ ප්‍රමුඛතාවය නිශ්චය කිරීමේ කාර්යය සඳහා, ගිණුම පිළිබඳව පැවරුම්ලාභියාගේ සුරකු අයිතිවාසිකම පරිපූර්ණ වූ අවස්ථාවේ දී පැවරුම්ලාභියා භාණ්ඩ පිළිබඳ සුරකු අයිතිවාසිකම පරිපූර්ණ කර තිබුණු ලෙසට සලකනු ලැබිය යුතු ය.

(6) පුද්ගලික දේපළ පත්‍රයක පැවරුම්ලාභියකු විසින්, (3) වන සහ (4) වන උපවගන්ති යටතේ භාණ්ඩ පිළිබඳ පරිපූර්ණ වූ සුරකු අයිතිවාසිකමක් ලබා ගන්නා අවස්ථාවක දී-

(අ) පැවරුම්ලාභියා සහ (1) වන උපවගන්තිය යටතේ බද්ධ වූ පරිපූර්ණ වූ සුරකු අයිතිවාසිකමක් දරන තැනැත්තා අතරෙහි ගත් කල, පුද්ගලික දේපළ පත්‍රය සම්බන්ධයෙන් ප්‍රමුඛතාව තිබූ තැනැත්තාට භාණ්ඩ සම්බන්ධයෙන් ද ප්‍රමුඛතාව තිබිය යුතු ය; සහ

(ආ) පැවරුම්ලාභියා සහ (1) වන උපවගන්තිය යටතේ බද්ධ වූ පරිපූර්ණ වූ සුරකු අයිතිවාසිකමක් දරන තැනැත්තා නොවන වෙනත් තැනැත්තකු අතරෙහි ගත් කල, භාණ්ඩ සම්බන්ධයෙන් පැවරුම්ලාභියාගේ ප්‍රමුඛතාව නිශ්චය කිරීමේ කාර්යය සඳහා, පුද්ගලික දේපළ පත්‍රය සම්බන්ධයෙන් පැවරුම්ලාභියාගේ සුරකු අයිතිවාසිකම පරිපූර්ණ වූ අවස්ථාවේ දී, පැවරුම්ලාභියා විසින් භාණ්ඩ පිළිබඳ සුරකු අයිතිවාසිකමක් පරිපූර්ණ කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය.

සාමාන්‍ය ව්‍යාපාර කටයුතු තුළ කරනු ලබන ගනුදෙනු

**34.** (1) විකිණීම මගින් සුරකු ගිවිසුමක් උල්ලංඝනය වන බව ගැනුම්කරු ද දැන සිටියේ නම් මිස, විකුණන ලද භාණ්ඩ පිළිබඳව යම් සුරකු අයිතිවාසිකමක් පරිපූර්ණව තිබුණේ වුව ද හා ගැනුම්කරු එය දැන සිටියේ වුව ද, සාමාන්‍ය ව්‍යාපාර කටයුතු තුළ භාණ්ඩ

විකුණන විකුණුම්කරුවකුගෙන් භාණ්ඩ මිල දී ගන්නා ගැනුම්කරුවකු විසින් විකුණුම්කරු ඒ භාණ්ඩ සම්බන්ධයෙන් දෙනු ලබන යම් සුරකු අයිතිවාසිකමකින් නිදහස්ව ඒ භාණ්ඩ ලබා ගන්නේ ය.

(2) (අ) ගැනුම්කරු විසින් භාණ්ඩවල සන්තකය ලබා ගත්තේ ද, නො ගත්තේ ද;

(ආ) විකුණුම්කරු යම් අවස්ථාවක දී භාණ්ඩවල සන්තකය දැරුවේ ද, නොදැරුවේ ද;

(ඇ) භාණ්ඩවල හිමිකම ගැනුම්කරුට මාරු වූයේ ද, නොවූයේ ද; හෝ

(ඈ) විකුණුම්කරු විසින් භාණ්ඩ පිළිබඳ සුරකු අයිතිවාසිකමක් ලබා ගෙන තිබුණේ ද, නොතිබුණේ ද,

යන්න නොසලකා (1) වන උපවගන්තියේ විධිවිධාන අදාළ විය යුතු ය.

(3) සාමාන්‍ය ව්‍යාපාර කටයුතු තුළ භාණ්ඩ බද්දට දෙනු ලබන බදු දීමනාකරුවකු විසින් භාණ්ඩ බද්දට දීමක දී, බද්දට දීම මගින් සුරකු ගිවිසුමක් උල්ලංඝනය වන බව බදු ගැනුම්කරු ද දැන සිටියේ නම් මිස, බදු දීමනාකරු විසින් ඒ භාණ්ඩ සම්බන්ධයෙන් දෙනු ලබන යම් සුරකු අයිතිවාසිකමකින් නිදහස්ව, බද්ද යටතේ වන බදු ගැනුම්කරුගේ අයිතිවාසිකම්වල ප්‍රමාණයට බදු ගැනුම්කරු භාණ්ඩ දරා සිටින්නේ ය.

(4) (අ) බදු ගැනුම්කරු විසින් භාණ්ඩවල සන්තකය ලබා ගත්තේ ද, නොගත්තේ ද; හෝ

(ආ) බදු දීමනාකරු යම් අවස්ථාවක දී භාණ්ඩවල සන්තකය දැරුවේ ද, නොදැරුවේ ද,

යන්න නොසලකා (3) වන උපවගන්තියේ විධිවිධාන අදාළ වන්නේ ය.

(5) සාමාන්‍ය ව්‍යාපාර කටයුතු තුළ පුද්ගලික දේපළ පත්‍රයක සන්තකය ලබා ගන්නා වූ සහ ඊට අලුත් වටිනාකමක් ලබා දෙන්නා වූ ඒ දේපළ පත්‍රය මිල දී ගන්නා ගැනුම්කරුවකුට -

(අ) එහි සන්තකය ලබා ගන්නා අවස්ථාවේ දී ඒ පුද්ගලික දේපළ පත්‍රය සුරකු අයිතිවාසිකමකට යටත්ව තිබුණු බව ඒ ගැනුම්කරු දැන නොසිටියේ නම්, ලියාපදිංචි කිරීම මගින් පරිපූර්ණත්වයට පත් වූ සුරකු අයිතිවාසිකමක් අභිබවා; හෝ

(ආ) ඒ ගැනුම්කරුගේ දැනුම්වත්බවේ ප්‍රමාණය කවරක් වුව ද, 31 වන වගන්තිය යටතේ වූ බඩු තොගවල ලාභවලට බද්ධ වී ඇති යම් සුරකු අයිතිවාසිකමක් අභිබවා,

ප්‍රමුඛතාව ලැබෙන්නේ ය.

(6) සාධන පත්‍රයක් වන හෝ ගනුදෙනු කළ හැකි හිමිකම් ලේඛනයක් වන සමපාර්ශ්වීය ද්‍රව්‍ය මිල දී ගත් ගැනුම්කරුවකු විසින් -

(අ) එසේ මිල දී ගත් සමපාර්ශ්වීය ද්‍රව්‍ය සඳහා වටිනාකම ලබා දුනි නම්;

(ආ) එම සමපාර්ශ්වීය ද්‍රව්‍ය සුරකු අයිතිවාසිකමකට යටත්ව තිබුණු බව නොදැන එම සමපාර්ශ්වීය ද්‍රව්‍ය මිල දී ගත්තේ නම්; සහ

(ඇ) සමපාර්ශ්වීය ද්‍රව්‍යවල සන්තකය ලබා ගෙන ඇත්නම්,

එම ගැනුම්කරුට, ලියාපදිංචි කිරීම මගින් පරිපූර්ණත්වයට පත් වූ හෝ 31 වන වගන්තිය හෝ 32 වන වගන්තිය යටතේ තාවකාලිකව පරිපූර්ණත්වයට පත් වූ යම් සුරකු අයිතිවාසිකමක් අභිබවා ප්‍රමුඛතාව ලැබෙන්නේ ය.

ගනුදෙනු කළ හැකි සාධන පත්‍ර ආදිය

**35.** (අ) (82 වන අධිකාරය වූ) විනිමය බිල්පත් ආඥාපනතේ අර්ථානුකූලව බිල්පතක, නෝට්ටුවක හෝ චෙක්පතක යථාකාල ධාරකයකු වන; හෝ

(ආ) ණයකරුවකුගෙන් මුදල් පැවරුම්ලාභියකු වන,

තැනැත්තකුගේ අයිතිවාසිකම්වලට, මේ පනතේ විධිවිධාන කිසිවක් මගින් බලපෑමක් සිදු නොවිය යුත්තේ ය.

## V වන කොටස
## ප්‍රමුඛතා

ප්‍රමුඛතාව පාලනය වන සාමාන්‍ය රීති

**36.** (1) එකම සමපාර්ශ්වීය ද්‍රව්‍ය පිළිබඳව වන සුරකු අයිතිවාසිකම් කෙරෙහි පහත දැක්වෙන ප්‍රමුඛතාව හා සම්බන්ධ සාමාන්‍ය රීති අදාළ විය යුතු යඃ-

(අ) ලියාපදිංචි කිරීම මගින් පරිපූර්ණත්වයට පත් වූ සුරකු අයිතිවාසිකම් අතර ප්‍රමුඛතාව, පරිපූර්ණත්වයට පත් වූ දිනය නොසලකා ලියාපදිංචි කළ දිනය අනුව නිශ්චය කරනු ලැබිය යුතු ය;

(ආ) ලියාපදිංචි කිරීම මගින් පරිපූර්ණත්වයට පත් වූ සුරකු අයිතිවාසිකමක් සහ සන්තකය දැරීම මගින් පරිපූර්ණත්වයට පත් වූ සුරකු අයිතිවාසිකමක් අතර ප්‍රමුඛතාව, සන්තකය දැරීමට පෙර මූල්‍යන ප්‍රකාශය ලියාපදිංචි කරනු ලැබුවේ ද යන කරුණ අනුව නිශ්චය කරනු ලැබිය යුතු ය; සහ

(ඇ) පරිපූර්ණත්වයට පත් නො වූ සුරකු අයිතිවාසිකම් අතර ප්‍රමුඛතාව ඒ සුරකු අයිතිවාසිකම් ඇති කරන ලද දිනය අනුව නිශ්චය කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ කාර්යය සඳහා -

(අ) අඛණ්ඩව පරිපූර්ණත්වයට පත් වූ සුරකු අයිතිවාසිකමක්, එය පළමුවෙන් ම පරිපූර්ණත්වයට පත් වූ ක්‍රමය මගින් ම පරිපූර්ණත්වයට පත් වී ඇති ලෙසට සියලු අවස්ථාවල දී සලකනු ලැබිය යුතු ය; තව ද,

(ආ) මුල් සමපාර්ශ්වීය ද්‍රව්‍යයක් පිළිබඳ සුරකු අයිතිවාසිකමක් ලියාපදිංචි කළ, සන්තකය ලබාගත් හෝ පරිපූර්ණත්වයට පත් වූ අවස්ථාව, ඒ සමපාර්ශ්වීය ද්‍රව්‍යයේ ලාභ පිළිබඳ සුරකු අයිතිවාසිකම ලියාපදිංචි කළ, සන්තකය ලබාගත් හෝ පරිපූර්ණත්වයට පත් වූ අවස්ථාව විය යුතු ය.

(3) පැවරීම සිදු කළ අවස්ථාවේ දී සුරකු අයිතිවාසිකම සම්බන්ධයෙන් පැවරුම්කරුට තිබුණු ප්‍රමුඛතාව ම එම සුරකු අයිතිවාසිකමේ පැවරුම්ලාභියා විසින් ද අත්කර ගත යුතු ය.

(4) (5) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, (1) වන උපවගන්තිය යටතේ සුරකු අයිතිවාසිකමකට ඇති ප්‍රමුඛතාව, සියලු අනාගත අත්තිකාරම්වලට ද අදාළ විය යුතු ය.

(5) පරිපූර්ණත්වයට පත් වූ සුරකු අයිතිවාසිකමකට පහත දැක්වෙන ප්‍රමාණයට පමණක් 5 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) ඡේදයේ සඳහන් විනිශ්චිත ණය හිමියකුගේ බැඳියාවක් අභිබවා ප්‍රමුඛතාව තිබිය යුතු යː-

(අ) ඒ ඡේදයේ සඳහන් නඩු තීන්දුව පිළිබඳ දැන්වීම විනිශ්චිත ණය හිමියා විසින් ලියාපදිංචි කිරීමට පෙර ගෙවන ලද අත්තිකාරම්;

(ආ) ඒ ඡේදයේ සඳහන් නඩු තීන්දුව පිළිබඳ දැන්වීම ලියාපදිංචි කිරීම පිළිබඳව සුරක්ෂිතලත් පාර්ශ්වය දැන ගැනීමට පෙර ගෙවන ලද අත්තිකාරම්;

(ඇ) (ආ) ඡේදයේ සඳහන් දැනුම ලබා ගැනීමට පෙර සුරක්ෂිතලත් පාර්ශ්වය විසින් ඇතුළත් වූ හා ණයකරු හැර වෙනත් තැනැත්තකු කෙරෙහි ඇති ව්‍යවස්ථාපිත අවශ්‍යතාවයකට හෝ නීත්‍යනුකූලව බැඳී සිටින වගකීමකට අනුව ගෙවන ලද අත්තිකාරම්; සහ

(ඈ) සමපාර්ශ්වීය ද්‍රව්‍ය ආරක්ෂා කිරීම, සංරක්ෂණය කිරීම, නඩත්තු කිරීම හෝ අලුත්වැඩියා කිරීම සඳහා සුරක්ෂිතලත් පාර්ශ්වය විසින් දරන ලද සාධාරණ පිරිවැය හා වියදම්.

**37.** (1) (අ) ණයකරු විසින් බඩු තොගවල සන්තකය ලබාගත් අවස්ථාවේ දී හෝ ණයකරුගේ ඉල්ලීම මත තුන්වන පාර්ශ්වයක් විසින් බඩු තොගවල සන්තකය ලබාගත් හෝ එහි සන්තකය දැරූ අවස්ථාවේ දී, අත්කර ගැනීමේ සුරකු අයිතිවාසිකම පරිපූර්ණත්වයට පත් වී ඇත්නම්; අත්කර ගැනීමේ සුරකු අයිතිවාසිකම්වල ප්‍රමුඛතාව

(ආ) ණයකරුට බඩු තොගවල සන්තකය ලැබීමට පෙර, අත්කර ගැනීමේ සුරකු අයිතිවාසිකමේ සුරක්ෂිතලත් පාර්ශ්වය විසින්-

(i) අත්කර ගැනීමේ සුරකු අයිතිවාසිකමට යටත් විය හැකි බඩු තොග අයිතම හෝ වර්ග සියල්ලට ම හෝ ඉන් ඇතැමකට සමාන බඩු තොග, අයිතම හෝ වර්ග වශයෙන් හෝ ඒ අයිතම හෝ වර්ග ඇතුළත් වන පරිදි;

(ii) බඩු තොග වශයෙන් හෝ බඩු තොග ඇතුළත් වන පරිදි; හෝ

(iii) ගිණුම් වශයෙන් හෝ ගිණුම් ඇතුළත් වන පරිදි,

සමපාර්ශ්වීය ද්‍රව්‍ය විස්තර කරමින් ලිඛිත දැන්වීමක්, එම සුරක්ෂිතලත් පාර්ශ්වය විසින් අත්කර ගැනීමේ සුරකු අයිතිවාසිකම ලියාපදිංචි කළ දිනයට පෙර මූල්‍යන ප්‍රකාශයක් ලියාපදිංචි කර ඇති අන් සෑම සුරක්ෂිතලත් පාර්ශ්වයක් වෙත ම ලබා දෙන්නේ නම්; සහ

(ඇ) (ආ) ඡේදයේ සඳහන් දැන්වීම ලබාදෙන තැනැත්තා විසින් ඒ දැන්වීමෙහි, අයිතම අනුව හෝ වර්ග අනුව ඒ බඩු තොග විස්තර කරමින්, තමාට ඒ ණයකරුගේ බඩු තොගය පිළිබඳ අත්කර ගැනීමේ සුරකු අයිතිවාසිකමක් තිබෙන බව හෝ අත්කර ගැනීමේ සුරකු අයිතිවාසිකමක් අත්කර ගැනීමට තමා අපේක්ෂා කරන බව සඳහන් කරන්නේ නම්,

බඩු තොග හෝ ඒවායේ ලාභ පිළිබඳ අත්කර ගැනීමේ සුරකු අයිතිවාසිකමකට, එම ණයකරු විසින් දෙන ලද එම සමපාර්ශ්වීය ද්‍රව්‍ය පිළිබඳ වෙනත් යම් සුරකු අයිතිවාසිකමක් අභිබවා ප්‍රමුඛතාව තිබිය යුතු ය.

(2) සමපාර්ශ්වීය ද්‍රව්‍ය හෝ සමපාර්ශ්වීය ද්‍රව්‍යවල ලාභ, බඩු තොග හෝ බඩු තොගවල ලාභ වන අවස්ථාවක දී හැර-

(අ) අස්පර්ශනීය සමපාර්ශ්වීය ද්‍රව්‍යයක් නොවන වෙනත් සමපාර්ශ්වීය ද්‍රව්‍යයක් සම්බන්ධයෙන් වන විට, එම සමපාර්ශ්වීය ද්‍රව්‍යය පිළිබඳ

අත්කර ගැනීමේ සුරකු අයිතිවාසිකම, ණයකරු, ණයකරු වශයෙන් සමපාර්ශ්වීය ද්‍රව්‍යයේ සන්තකය ලබා ගැනීමෙන් හෝ ණයකරුගේ ඉල්ලීම මත තුන්වන පාර්ශ්වයක් විසින් සමපාර්ශ්වීය ද්‍රව්‍යයේ සන්තකය ලබා ගැනීමෙන් හෝ දැරීමෙන් යන දෙකින් පළමුව සිදුවන අවස්ථාවේ සිට දින දහයක් ඇතුළත හෝ ඊට පෙර පරිපූර්ණත්වයට පත් වූයේ නම්; හෝ

(ආ) අස්පර්ශනීය සමපාර්ශ්වීය ද්‍රව්‍යයක් සම්බන්ධයෙන් වන විට, එම අස්පර්ශනීය සමපාර්ශ්වීය ද්‍රව්‍යය පිළිබඳ අත්කර ගැනීමේ සුරකු අයිතිවාසිකම ඇතිවීමෙන් පසු දින දහයක් ඇතුළත හෝ ඊට පෙර, එම අත්කර ගැනීමේ සුරකු අයිතිවාසිකම පරිපූර්ණත්වයට පත් වූයේ නම්,

සමපාර්ශ්වීය ද්‍රව්‍ය හෝ සමපාර්ශ්වීය ද්‍රව්‍යවල ලාභ පිළිබඳ අත්කර ගැනීමේ සුරකු අයිතිවාසිකමකට එම ණයකරු විසින් දෙන ලද එම සමපාර්ශ්වීය ද්‍රව්‍යය පිළිබඳ වෙනත් යම් සුරකු අයිතිවාසිකමක් අභිබවා ප්‍රමුඛතාව තිබිය යුතු ය.

(3) (1) වන සහ (2) වන උපවගන්තිවල විධිවිධාන අදාළ වීම හේතුකොට ගෙන අත්කර ගැනීමේ සුරකු අයිතිවාසිකම් එකකට වැඩි ප්‍රමාණයකට ප්‍රමුඛතාව දෙනු ලබන්නේ නම්, විකුණුම්කරුගේ යම් අත්කර ගැනීමේ සුරකු අයිතිවාසිකමක් ඇත්නම් ඊට, එම ණයකරු විසින් දෙනු ලබන වෙනත් යම් අත්කර ගැනීමේ සුරකු අයිතිවාසිකමක් අභිබවා ප්‍රමුඛතාව තිබිය යුතු ය.

ද්‍රව්‍ය හා සේවා සඳහා වූ අයිතමවල ප්‍රමුඛතාව

**38.** සාමාන්‍ය ව්‍යාපාර කටයුතු තුළ භාණ්ඩ සම්බන්ධයෙන් ද්‍රව්‍ය හෝ සේවා සැපයීමේ ප්‍රතිඵලයක් ලෙස උද්ගත වන භාණ්ඩ කෙරෙහි වූ කැප අයිතියකට ප්‍රමුඛතාවක් ලබා නොදිය යුතු බවට විධිවිධාන සලස්වන යම් නීතියක් යටතේ එම කැප අයිතිය උද්ගත වී ඇත්නම් මිස, එසේ උද්ගත වන භාණ්ඩ කෙරෙහි වූ කැප අයිතියකට, එම භාණ්ඩ පිළිබඳ පරිපූර්ණත්වයට පත් වූ හෝ පරිපූර්ණත්වයට පත් නොවූ සුරකු අයිතිවාසිකමක් අභිබවා ප්‍රමුඛතාව තිබිය යුතු ය.

බෝග පිළිබඳ සුරකුු අයිතිවාසිකම

**39.** (1) නිෂ්පාදන කන්නය තුළ දී බෝග නිෂ්පාදනය කිරීමට ණයකරුට හැකි වන පරිදි, පැළ කිරීම මගින් හෝ අන්‍යාකාරයකින් එම බෝග වැඩුණු බෝග බවට පත්වීමට මාස හයකට වැඩි නොවන කාලසීමාවකට පෙර දෙන ලද එම බෝග පිළිබඳ හෝ එම බෝගවල ලාභ පිළිබඳ පරිපූර්ණත්වයට පත් වූ සුරකුු අයිතිවාසිකමකට, වටිනාකම ලබා දෙන තැනැත්තාට යම් පූර්ව සුරකුු අයිතිවාසිකමක් පිළිබඳව දැන්වීම් ලැබී තිබුණ ද, පැළ කිරීම මගින් හෝ අන්‍යාකාරයකින් එම බෝග වැඩුණු බෝග බවට පත්වීමට මාස හයකට වැඩි කාලසීමාවකට පෙර ඉටු කිරීමට තිබූ බැඳීම් පෙර පැවති බැඳියාව මගින් සුරක්ෂිත කරන ප්‍රමාණයට, ඒ සමපාර්ශ්වීය ද්‍රව්‍යය පිළිබඳව කලින් පරිපූර්ණත්වයට පත් වූ සුරකුු අයිතිවාසිකමක් අභිබවා ප්‍රමුඛතාව තිබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය අදාළ වීම හේතු කොට ගෙන පරිපූර්ණත්වයට පත් වූ සුරකුු අයිතිවාසිකම් එකකට වැඩි ප්‍රමාණයකට ප්‍රමුඛතාව දෙනු ලබන අවස්ථාවක, එක් එක් සුරකුු අයිතිවාසිකම සම්බන්ධයෙන් දුන් අත්තිකාරම් මුදල් ප්‍රමාණය සම්පූර්ණ අත්තිකාරම් මුදලට දරන අනුපාතය අනුව එක් එක් සුරකුු අයිතිවාසිකමට සමාන ප්‍රමුඛතාව තිබිය යුතු ය.

සවිකිරීම් පිළිබඳ සුරකුු අයිතිවාසිකම

**40.** (1) (අ) යම් භාණ්ඩ සවිකිරීමක් බවට පත්වීමට පෙරාතුව බද්ධ වූ එම භාණ්ඩ පිළිබඳ සුරකුු අයිතිවාසිකමකට, නිශ්චල දේපළ පිළිබඳ යම් බැඳියාවක් ඇති තැනැත්තකුගේ හිමිකම්පෑම අභිබවා එම සවිකිරීම සම්බන්ධයෙන් ප්‍රමුඛතාව තිබිය යුතු ය; හෝ

(ආ) යම් භාණ්ඩ, සවිකිරීමක් බවට පත්වීමෙන් පසුව බද්ධ වූ එම භාණ්ඩ පිළිබඳ සුරකුු අයිතිවාසිකමකට, නිශ්චල දේපළ පිළිබඳ යම් බැඳියාවක් පසුව අත්කර ගත් යම් තැනැත්තකුගේ හිමිකම්පෑම අභිබවා එම සවිකිරීම සම්බන්ධයෙන් ප්‍රමුඛතාව තිබිය යුතු නමුත්, භාණ්ඩ පිළිබඳ සුරකුු අයිතිවාසිකම බද්ධ වූ අවස්ථාවේ දී නිශ්චල දේපළ පිළිබඳ ලියාපදිංචි කරන ලද

බැඳියාවක් තිබුණු සහ සුරකු අයිතිවාසිකම සඳහා ලිඛිතව කැමැත්ත දී නැති හෝ සවිකිරීම හා සම්බන්ධ බැඳියාවකට හිමිකම නොපාන යම් තැනැත්තකු අභිබවා ප්‍රමුඛතාව නොතිබිය යුතු ය.

(2) සුරකු අයිතිවාසිකම පිළිබඳ දැනුමකින් තොරව, වාර්තාගත වී ඇති පූර්ව බැඳීමක් යටතේ පසුව මිල දී ගැනීමක් හෝ පසුව අත්තිකාරම් දීමක් කරනු ලැබී නම් හෝ ගිවිස ගත්තේ නම් හා (117 වන අධිකාරය වූ) ලේඛන ලියාපදිංචි කිරීමේ ආඥාපනතේ III වන පරිච්ඡේදය ප්‍රකාරව ඒ පිළිබඳ පූර්ව දැන්වීමක් ලියාපදිංචි කර ඇත්නම්, (1) වන උපවගන්තියේ සඳහන් සුරකු අයිතිවාසිකමක් -

(අ) නිශ්චල දේපළ පිළිබඳ යම් බැඳියාවක් පසුව වටිනාකමක් සඳහා මිල දී ගන්නා ගැනුම්කරුවකුගේ බැඳියාවට; හෝ

(ආ) ණයහිමියා විසින් පසුව අත්තිකාරම් ලබා දෙන තාක් දුරට, නිශ්චල දේපළ පිළිබඳ වාර්තාගත වී ඇති පූර්ව බැඳීමක් සහිත ණයහිමියකුගේ බැඳියාවට,

ද්විතීයික විය යුතු ය.

(3) නිශ්චල දේපළ කෙරෙහි බැඳියාවක් ඇති තැනැත්තකුගේ හිමිකම් පෑම අභිබවා සවිකිරීමක් සම්බන්ධයෙන් සුරක්ෂිතලත් පාර්ශ්වයට ප්‍රමුඛතාවක් ඇති අවස්ථාවක දී, පැහැර හැරීමක දී සහ පැහැර හැරීමක් සම්බන්ධයෙන් මෙම පනතේ ඇති විධිවිධානවලට යටත් ව, සුරක්ෂිතලත් පාර්ශ්වය විසින් අන්‍යාකාරයකින් එකඟ වී ඇත්නම් මිස, එම නිශ්චල දේපළේ වටිනාකම අඩුවීම හැර, එම සවිකිරීම නොමැති වීම නිසා හෝ එම සවිකිරීම වෙනුවට වෙනත් සවිකිරීමක් කළ යුතු වීමේ අවශ්‍යතාව නිසා සිදු වන යම් භෞතික හානියක් අලුත්වැඩියා කිරීම සඳහා වන පිරිවැය නිශ්චල දේපළ කෙරෙහි බැඳීමක් ඇති යම් තැනැත්තකු වෙත හෝ ණයකරු නොවන්නා වූ එම නිශ්චල දේපළේ අයිතිකරු වෙත සුරක්ෂිතලත් පාර්ශ්වය විසින් ප්‍රතිපූර්ණය කරනු ලබන්නේ නම්, සුරක්ෂිතලත්

පාර්ශ්වයට එම සවිකිරීම එම නිශ්චල දේපළෙන් ඉවත් කරනු ලැබිය හැකි ය.

(4) (3) වන උපවගන්තිය යටතේ යම් ප්‍රතිපූර්ණයක් සඳහා හිමිකම් ලබන තැනැත්තකු විසින්, එම ප්‍රතිපූර්ණය සඳහා සුරක්ෂිතලත් පාර්ශ්වය විසින් ප්‍රමාණවත් සුරැකුමක් ලබා දෙන තෙක් එම සවිකිරීම ඉවත් කිරීම සඳහා අවසර දීම ප්‍රතික්ෂේප කරනු ලැබිය හැකි ය.

(5) නිශ්චල දේපළකින් සවිකිරීමක් ඉවත් කිරීමට අයිතියක් ඇති යම් සුරක්ෂිතලත් පාර්ශ්වයක් විසින්, එම නිශ්චල දේපළ කෙරෙහි බැඳියාවක් ඇති බවට අදාළ ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලය විසින් පවත්වාගෙන යනු ලබන වාර්තාවල නම සඳහන් වන එක් එක් තැනැත්තා වෙත, එම සවිකිරීම ඉවත් කිරීම පිළිබඳ සුරක්ෂිතලත් පාර්ශ්වයේ අදහස පිළිබඳව ලිඛිත දැන්වීමක් භාර දෙනු ලැබිය යුතු ය. එම දැන්වීමෙහි පහත දැක්වෙන තොරතුරු අන්තර්ගත විය යුතු යː-

(අ) සුරක්ෂිතලත් පාර්ශ්වයේ නම සහ ලිපිනය;

(ආ) ඉවත් කිරීමට නියමිත සවිකිරීම හඳුනා ගැනීමට ප්‍රමාණවත් එම සවිකිරීම පිළිබඳ විස්තරයක්;

(ඇ) සුරක්ෂිතලත් පාර්ශ්වයේ සුරකු අයිතිවාසිකම, මගින් සුරක්ෂිත කරන ලද වගකීම ඉටු කිරීම සඳහා අවශ්‍ය වන මුදල;

(ඈ) සවිකිරීම සවිකොට ඇත්තේ යම් නිශ්චල දේපළකට ද, එම නිශ්චල දේපළ හඳුනා ගනු ලැබීමට ප්‍රමාණවත් එම නිශ්චල දේපළ පිළිබඳ විස්තරයක්; සහ

(ඉ) දැන්වීම භාර දීමෙන් දින දහයකට අඩු නොවන දිනයක් විය යුතු, දැන්වීමේ නිශ්චිතව සඳහන් දින හෝ එදිනට පෙරාතුව සුරක්ෂිත කරන ලද මුදල ගෙවන්නේ නම් මිස,

සවිකිරීම ඉවත් කිරීමේ තම අදහස පිළිබඳ ප්‍රකාශයක්.

(6) (5) වන උපවගන්තියේ සඳහන් දැන්වීම අදාළ ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ වාර්තාවල සඳහන් වන, දැන්වීම ලබා දිය යුතු තැනැත්තාගේ ලිපිනය වෙත හෝ සමාගමක් සම්බන්ධයෙන් වන විට, සමාගමේ ලියාපදිංචි කාර්යාලය වෙත හෝ සමාගම වෙනුවෙන් දැන්වීමක් භාර ගැනීමට බලය පවරා ඇත්තා වූ ඇටෝර්නි බලකරුවකුගේ ලිපිනය වෙත ලියාපදිංචි තැපෑල මගින් යැවීමෙන් භාර දෙනු ලැබිය යුතු ය.

(7) සවිකිරීමක් සම්බන්ධයෙන් සුරකු අයිතිවාසිකමකට යටත් ව ඇති යම් නිශ්චල දේපළක් කෙරෙහි බැඳියාවක් ඇති යම් තැනැත්තකු විසින්, (3) වන උපවගන්තියේ විධිවිධානවලට අනුව සුරක්ෂිතලත් පාර්ශ්වය විසින් එම දේපළෙන් එම සවිකිරීම ඉවත් කිරීමට පෙරාතුව, එම තැනැත්තාගේ බැඳියාව අභිබවා ප්‍රමුඛතාව ඇති සුරකු අයිතිවාසිකම සම්බන්ධයෙන් ගෙවිය යුතු මුදල සුරක්ෂිතලත් පාර්ශ්වය වෙත ගෙවීමෙන් පසුව එම සවිකිරීම රඳවා ගනු ලැබිය හැකි ය.

එක්කිරීම් පිළිබඳ සුරකු අයිතිවාසිකම

**41.** (1) (2) වන සහ (3) වන උපවගන්තිවල විධිවිධානවලට සහ 42 වන වගන්තියේ විධිවිධානවලට යටත් ව-

(අ) එක්කිරීමක් බවට පත්වීමට පෙරාතුව භාණ්ඩ කිසිවක් සම්බන්ධයෙන් බද්ධ වූ යම් සුරකු අයිතිවාසිකමකට, භාණ්ඩ සමස්තය සම්බන්ධයෙන් යම් තැනැත්තකුගේ හිමිකම්පෑමක් අභිබවා එම එක්කිරීම සම්බන්ධයෙන් ප්‍රමුඛතාව තිබිය යුතු ය; සහ

(ආ) එක්කිරීමක් බවට පත්වීමෙන් පසුව භාණ්ඩ කිසිවක් සම්බන්ධයෙන් බද්ධ වූ යම් සුරකු අයිතිවාසිකමකට, භාණ්ඩ සමස්තය සම්බන්ධයෙන් බැඳියාවක් පසුව අත්කර ගනු ලැබූ යම් තැනැත්තකුගේ හිමිකම්පෑමක් අභිබවා එම එක් කිරීම සම්බන්ධයෙන්

ප්‍රමුඛතාව තිබිය යුතු නමුත්, එක්කිරීමට සුරකු අයිතිවාසිකම බද්ධ වූ දිනයේ දී භාණ්ඩවල සමස්තය පිළිබඳව බැඳියාවක් තිබුණා වූ ද සහ භාණ්ඩ සමස්තයේ කොටසක් වශයෙන් එක්කිරීම පිළිබඳ සුරකු අයිතිවාසිකමට ලිඛිතව කැමැත්ත දී නොමැති හෝ එක් කිරීම පිළිබඳ බැඳියාවකට හිමිකම් නොපාන යම් තැනැත්තකු අභිබවා ප්‍රමුඛතාව නොතිබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ සඳහන් සුරකු අයිතිවාසිකමක් -

(අ) පූර්වයෙන් පරිපූර්ණත්වයට පත් වූ සුරකු අයිතිවාසිකමක් යටතේ වූ පසුකාලීන විකිණීම හෝ පසුකාලීන අත්තිකාරම් ගෙවීම එම සුරකු අයිතිවාසිකම පරිපූර්ණ වීමට පෙරාතුව කරන ලද්දේ නම් හෝ ඒ සඳහා ගිවිස ගත්තේ නම්-

(i) භාණ්ඩ සමස්තය පිළිබඳව යම් බැඳියාවක් පසුව මිල දී ගත් ගැනුම්කරුවකුගේ බැඳියාවට; සහ

(ii) භාණ්ඩ සමස්තය සම්බන්ධයෙන් පූර්වයෙන් පරිපූර්ණත්වයට පත් වූ සුරකු අයිතිවාසිකමක් ඇති ණය හිමියකුගේ බැඳියාවට, එම ණය හිමියා පසුව අත්තිකාරම් ගෙවනු ලබන තාක් දුරට,

ද්විතීයික වන්නේ ය; සහ

(ආ) සුරකු අයිතිවාසිකම පරිපූර්ණත්වයට පත් වීමට පෙරාතුව නඩු තීන්දුව පිළිබඳ දැන්වීමක් හෝ හිමිකම් පෑමේ දැන්වීමක් ලියාපදිංචි කරනු ලබන ණයහිමියකුගේ බැඳියාවට ද්විතීයික වන්නේ ය.

(3) (2) වන උපවගන්තියේ (ආ) ඡේදයේ විධිවිධානවල කුමක් සඳහන් වුව ද, ණයකරු විසින් එක්කිරීම්වල සන්තකය ලබා ගැනීමට පෙර හෝ එසේ ලබා ගැනීමෙන් පසු දින දහයක් ඇතුළත පරිපූර්ණත්වයට පත් වූ එක්කිරීමක් පිළිබඳ අත්කර ගැනීමේ සුරකු අයිතිවාසිකමකට එම ඡේදයේ සඳහන් කර ඇති ණයහිමියකුගේ බැඳියාව අභිබවා ප්‍රමුඛතාව තිබිය යුතු ය.

(4) භාණ්ඩ සමස්තය කෙරෙහි බැඳියාවක් ඇති තැනැත්තකුගේ හිමිකම්පෑම අභිබවා සුරක්ෂිතලත් පාර්ශ්වයකට එක්කිරීමක් සම්බන්ධයෙන් වූ බැඳියාවකට ප්‍රමුඛතාවක් ඇත්නම්, පැහැර හැරීමක දී සහ පැහැර හැරීමක් සම්බන්ධයෙන් මෙම පනතේ ඇති විධිවිධානවලට යටත් ව, සුරක්ෂිතලත් පාර්ශ්වය විසින් අන්‍යාකාරයකින් එකඟ වී ඇත්නම් මිස, එම භාණ්ඩ සමස්තයේ වටිනාකම අඩු වීම හැර, එම එක්කිරීම නොමැති වීමේ හේතුව නිසා හෝ එම එක්කිරීම වෙනුවට වෙනත් එක්කිරීමක් කළ යුතු වීමේ අවශ්‍යතාව නිසා සිදු වන යම් භෞතික හානියක් අලුත්වැඩියා කිරීම සඳහා වන පිරිවැය, එම භාණ්ඩ සමස්තය කෙරෙහි බැඳීමක් ඇති යම් තැනැත්තකු වෙත හෝ ණයකරු නොවන්නා වූ එම භාණ්ඩ සමස්තයෙහි අයිතිකරු වෙත සුරක්ෂිතලත් පාර්ශ්වය විසින් ප්‍රතිපූර්ණය කරනු ලබන්නේ නම්, සුරක්ෂිතලත් පාර්ශ්වයට එම එක්කිරීම එම භාණ්ඩ සමස්තයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය.

(5) (4) වන උපවගන්තිය යටතේ යම් ප්‍රතිපූර්ණයක් සඳහා හිමිකම් ලබන තැනැත්තකු විසින් එම ප්‍රතිපූර්ණය සඳහා සුරක්ෂිතලත් පාර්ශ්වය විසින් ප්‍රමාණවත් සුරැකුමක් ලබාදෙන තෙක් එම එක්කිරීම ඉවත් කිරීම සඳහා අවසර දීම ප්‍රතික්ෂේප කරනු ලැබිය හැකි ය

(6) සමස්තයෙන් යම් එක්කිරීමක් ඉවත් කිරීමට අයිතියක් ඇති යම් සුරක්ෂිතලත් පාර්ශ්වයක් විසින් ඉතිරි භාණ්ඩ සඳහා බැඳියාවක් ඇති බවට එම සුරක්ෂිතලත් පාර්ශ්වය දැන සිටින එක් එක් තැනැත්තා වෙත සහ ලියාපදිංචි කිරීම සඳහා භාණ්ඩවල අනුක්‍රමික හඳුනා ගැනීමේ අංකය අවශ්‍ය වන අවස්ථාවක, එම අංකය මගින් ණයකරුගේ නමට එරෙහිව ලියාපදිංචි කිරීමෙන් පරිපූර්ණත්වයට පත් වූ එම ඉතිරි භාණ්ඩ පිළිබඳ සුරකු අයිතිවාසිකමක් ඇති යම් තැනැත්තකු වෙත එම එක්කිරීම ඉවත්

කිරීම පිළිබඳ සුරක්ෂිතලත් පාර්ශ්වයේ අදහස පිළිබඳව පහත දැක්වෙන තොරතුරු අඩංගු ලිඛිත දැන්වීමක් භාර දෙනු ලැබිය යුතු යඃ-

(අ) සුරක්ෂිතලත් පාර්ශ්වයේ නම සහ ලිපිනය;

(ආ) ඉවත් කිරීමට නියමිත එක්කිරීම හඳුනා ගැනීමට ප්‍රමාණවත් එම එක්කිරීම පිළිබඳ විස්තරයක්;

(ඇ) සුරක්ෂිතලත් පාර්ශ්වයේ සුරකු අයිතිවාසිකම මඟින් සුරක්ෂිත කරන ලද වගකීම ඉටු කිරීම සඳහා අවශ්‍ය වන මුදල;

(ඈ) වෙනත් භාණ්ඩ හඳුනා ගැනීමට ප්‍රමාණවත් එම වෙනත් භාණ්ඩ පිළිබඳ විස්තරයක්; සහ

(ඉ) දැන්වීම භාරදීමෙන් දින දහයකට අඩු නොවන දිනයක් විය යුතු, දැන්වීමේ නිශ්චිතව සඳහන් දින හෝ එදිනට පෙරාතුව සුරක්ෂිත කරන ලද මුදල ගෙවන්නේ නම් මිස, එක්කිරීම සමස්තයෙන් ඉවත් කිරීමේ තම අදහස පිළිබඳ ප්‍රකාශයක්.

(7) (6) වන උපවගන්තියේ සඳහන් දැන්වීම, එම එක්කිරීම ඉවත් කිරීමේ දිනයට යටත් පිරිසෙයින් දින දහයකට පෙරාතුව ලියාපදිංචි තැපෑලෙන් භාරදෙනු ලැබිය යුතු ය.

(8) එක්කිරීමක් සම්බන්ධයෙන් සුරකු අයිතිවාසිකමකට යටත් ව ඇති භාණ්ඩ සමස්තය පිළිබඳ යම් බැඳියාවක් ඇති යම් තැනැත්තකු විසින්, (4) වන උපවගන්තියේ විධිවිධානවලට අනුව සුරක්ෂිතලත් පාර්ශ්වය විසින් එම එක් කිරීම ඉවත් කිරීමට පෙරාතුව එම තැනැත්තාගේ බැඳියාව අභිබවා ප්‍රමුඛතාවක් ඇති සුරකු අයිතිවාසිකම සම්බන්ධයෙන් ගෙවිය යුතු මුදල සුරක්ෂිතලත් පාර්ශ්වය වෙත ගෙවීමෙන් පසුව එම එක්කිරීම රඳවාගනු ලැබිය හැකි ය.

සකස් කරන ලද හෝ සම්මිශ්‍රිත වත්කම් පිළිබඳ සුරකු අයිතිවාසිකම

**42.** (1) යම් නිෂ්පාදනයක හෝ නිෂ්පාදන සමූහයක කොටසක් බවට පසුව පත් වූ භාණ්ඩ පිළිබඳ පරිපූර්ණ කරන ලද සුරකු අයිතිවාසිකමක්-

(අ) එම භාණ්ඩ කෙසේ නිෂ්පාදනය කර, සකස් කර, එකලස් කර හෝ සම්මිශ්‍ර කර ඇත් ද යත්, ඒවායේ අනන්‍යතාවය එම නිෂ්පාදනය තුළ හෝ නිෂ්පාදන සමූහය තුළ නැති වන්නේ නම්; සහ

(ආ) එම නිෂ්පාදනයට හෝ නිෂ්පාදන සමූහයට එක් සුරකු අයිතිවාසිකමකට වඩා බද්ධ වන්නේ නම්,

එම භාණ්ඩය හෝ භාණ්ඩ සමූහය සම්බන්ධයෙන් අඛණ්ඩව පවතින අතර, එක් එක් බැඳියාව මුලින්ම බද්ධ වූ භාණ්ඩවල පිරිවැය සම්පූර්ණ නිෂ්පාදනයේ හෝ නිෂ්පාදන සමූහයේ පිරිවැයට දරන අනුපාතයට අනුව සුරක්ෂිතලත් පාර්ශ්වයන් සමාන මට්ටමෙහිලා ශ්‍රේණිගත කරනු ලැබිය යුතු ය.

(2) තවදුරටත් හඳුනාගත නොහැකි වන පරිද්දෙන් වෙනත් අරමුදල් සමඟ සම්මිශ්‍රිතව ඇති අරමුදල් ස්වරූපයෙන් වූ ලාභ-

(අ) හඳුනාගත හැකි ලාභ ලෙස සලකනු ලැබිය යුතු ය; සහ

(ආ) සම්මිශ්‍රණය වීම සිදු වීමෙන් පසුව ඕනෑම අවස්ථාවක දී අරමුදල්වල සම්පූර්ණ මුදල, සම්මිශ්‍රණය වීම සිදු වීමට පෙරාතුව පැවති ලාභ මුදල් ප්‍රමාණයට වඩා අඩුවන බවට සොයා ගනු ලබන්නේ නම් එවිට සම්මිශ්‍රිත අරමුදල් තරගකාරී හිමිකම්පාන්නන් අතර සමානුපාතික පදනමක් මත බෙදී යා යුතුය.

නිශ්චල දේපල පිළිබඳ බද්දක් යටතේ වූ ගෙවීම් සඳහා අයිතිවාසිකම

**43.** මේ පනත අදාළ වන්නා වූ යම් නිශ්චල දේපළ පිළිබඳ බද්දක විෂය වස්තුව වන, බද්ද පිළිබඳව හෝ නිශ්චල දේපළ පිළිබඳව වූ බදු දීමනාකරුගේ බැඳියාව වටිනාකමක් සඳහා අත්කර ගන්නා තැනැත්තකු විසින් එම තැනැත්තාගේ එම බැඳියාව හෝ එම බැඳියාව

පිළිබඳ දැන්වීම, සුරක්ෂිතලත් පාර්ශ්වය විසින් එම බැඳියාව හෝ එම බැඳියාව පිළිබඳ දැන්වීම අදාළ ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ ලියාපදිංචි කිරීමට පෙර අදාළ ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ ලියාපදිංචි කරන්නේ නම්, ඒ බද්ද යටතේ වන යම් ගෙවීමක් සඳහා වූ අයිතිවාසිකමක් පිළිබඳ සුරකු අයිතිවාසිකමක් එම තැනැත්තාගේ බැඳියාවට ද්විතීයික විය යුතු ය.

නිශ්චල දේපල පිළිබඳ උකසක් යටතේ වූ ගෙවීම් සඳහා අයිතිවාසිකම

**44.** මේ පනත අදාළ වන්නා වූ යම් නිශ්චල දේපළ පිළිබඳ උකසක් හෝ ඍණ භාරයක් පිළිබඳ උකස්ලාභියාගේ හෝ ඍණභාරලාභියාගේ බැඳියාව වටිනාකමක් සඳහා අත්කර ගන්නා තැනැත්තකු විසින් එම තැනැත්තාගේ එම බැඳියාව, එම උකස හෝ ඍණභාරය යටතේ වන ගෙවීමක් පිළිබඳ සුරකු අයිතිවාසිකම පිළිබඳ දැන්වීම අදාළ ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ ලියාපදිංචි කරනු ලැබීමට පෙරාතුව අදාළ ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ ලියාපදිංචි කරන්නේ නම්, ඒ උකස හෝ ඍණභාරය යටතේ වන යම් ගෙවීමක් සඳහා වූ සුරකු අයිතිවාසිකමක් එම තැනැත්තාගේ එම බැඳියාවට ද්විතීයික විය යුතු ය.

ස්වේච්ඡාවෙන් ද්විතීයික කරනු ලැබීම

**45.** (1) සුරක්ෂිතලත් පාර්ශ්වයක් විසින් සුරකු ගිවිසුමක් මගින් හෝ තරගකාරී හිමිකම්පාන්නන් අතර ඇතුළත් වූ වෙනම ගිවිසුමක් මගින් සුරක්ෂිතලත් පාර්ශ්වයේ සුරකු අයිතිවාසිකම වෙනත් යම් බැඳියාවකට ද්විතීයික කරනු ලැබිය හැකි අතර, එම ද්විතීයික කරනු ලැබීම එහි නියමයන් ප්‍රකාරව බලාත්මක විය යුතු ය.

(2) ද්විතීයික කරනු ලැබීමක් පාර්ශ්ව අතර එළැඹෙන ලද නියමයන්ට අනුව බලාත්මක විය යුතු අතර, ද්විතීයික කරනු ලැබීමෙන් ප්‍රතිලාභයක් සැපයීමට අදහස් කරන ලද තැනැත්තා හෝ තැනැත්තන් පන්තිය තුන්වන පාර්ශ්වයක් වන්නේ නම් එම තුන්වන පාර්ශ්වය විසින් එම ද්විතීයික කරනු ලැබීම බලාත්මක කරනු ලැබිය හැකි ය.

සමපාර්ශ්වීය ද්‍රව්‍ය පිළිබඳ ණයකරුවකුගේ අයිතිවාසිකම් අත්සතු කිරීම

**46.** සමපාර්ශ්වීය ද්‍රව්‍ය පිළිබඳ ණයකරුවකුගේ අයිතිවාසිකම් පැවරීම තහනම් කෙරෙන හෝ පැවරීමක් පැහැර හැරීමක් වන බව ප්‍රකාශ කෙරෙන යම් විධිවිධානයක් යම් සුරකු ගිවිසුමක ඇතුළත් වුව ද, සමපාර්ශ්වීය ද්‍රව්‍ය පිළිබඳ ණයකරුවකුගේ අයිතිවාසිකම් ස්වේච්ඡාවෙන් හෝ අන්‍යාකාරයකින් පවරනු ලැබිය හැකි නමුදු, එවැනි කිසිදු පැවරීමකින් සුරකු ගිවිසුමක් යටතේ හෝ

අන්‍යාකාරකින් වූ සුරක්ෂිතලත් පාර්ශ්වයේ අයිතිවාසිකම්වලට අගතියක් නොවිය යුතු ය.

අස්පර්ශනීය ද්‍රව්‍ය ආදිය පවරා දීම හා තුන්වන පාර්ශ්විය ගිණුම් ණයකරුවන්ගේ අයිතිවාසිකම්

**47.** (1) යම් ගිණුම් ණයකරුවකු විසින්, එම ගිණුම් ණයකරු හා පැවරුම්කරුවකු අතර වූ යම් ගිවිසුමක් තුළින් උද්ගත වන විත්තිවාචක හෝ හිමිකම්පෑම් තහවුරු නොකිරීමට බලාත්මක කළ හැකි ගිවිසුමකට එළැඹී ඇත්නම් මිස, යම් ගිණුම් ණයකරුවකු විසින් පැවරුම්කරුට එරෙහිව විත්තිවාචකයක් වශයෙන්-

(අ) සාධාරණත්ව හිලව් කිරීම් සහ දුර්නියෝජන ද ඇතුළු ව, එම ගිවිසුමේ හෝ ආශ්‍රිත ගිවිසුමක කොන්දේසි තුළින් උද්ගත වන පැවරුම්කරුට එරෙහිව ගිණුම් ණයකරු වෙත පවතින සියලු විත්තිවාචක; සහ

(ආ) පැවරුම්කරු විසින් ගිණුම් ණයකරු වෙත ගෙවීමට ඇත්තා වූ ද, පවරාදීමේ දැන්වීම ගිණුම් ණයකරු වෙත ලැබීමට පෙරාතුව ගිණුම් ණයකරු වෙත ගෙවනු ලැබිය යුතු වූ ද, යම් ණය මුදලක් හිලව් කිරීමේ අයිතිය,

අදාළ කර ගනු ලැබිය හැකි ය.

(2) යම් ගිණුමක් හෝ පුද්ගලික දේපළ පත්‍රයක් සම්බන්ධයෙන් වගකීමට බැඳී සිටින යම් තැනැත්තකු විසින්, අදාළ අයිතිවාසිකම් සාධාරණ ලෙස දක්වමින් සහ ගිණුම හෝ පුද්ගලික දේපළ පත්‍රය පවරා දී ඇති බව සඳහන් කරමින් දැන්වීමක් තමා වෙත ලැබෙන තෙක් පැවරුම්කරු වෙත ගෙවීම් කරනු ලැබිය හැකි ය. තව ද, ගිණුම් ණයකරු ඉල්ලීමක් කළහොත් පවරාදීම සිදුකර ඇති බවට වූ සාක්ෂි පැවරුම්ලාභියා විසින් සාධාරණ කාලයක් ඇතුළත ඉදිරිපත් කරනු ලැබිය යුතු අතර, පැවරුම්ලාභියා විසින් එසේ ඉදිරිපත් නොකළහොත් එම තැනැත්තාට පැවරුම්කරු වෙත ගෙවීම් කරනු ලැබිය හැකි ය.

(3) යම් ගිවිසුමක් යටතේ පවරා දී ඇති ගෙවීමක් හෝ ගෙවීමක කොටසක් සඳහා ඇති අයිතිය ඉටු කිරීම මගින් උපයා

ගෙන නොමැති තාක් දුරට, පවරා දීම පිළිබඳ දැන්වීම පිළිබඳව නොසලකා, සාධාරණ වාණිජමය ප්‍රමිතීන්ට අනුකූලව සහ ගිවිසුම යටතේ වන පැවරුම්ලාභියාගේ අයිතිවාසිකම් කෙරෙහි හෝ ගිවිසුම ඉටු කිරීමේ පැවරුම්කරුගේ හැකියාව කෙරෙහි සැලකිය යුතු අහිතකර බලපෑමකින් තොරව සද්භාවයෙන් ගිවිසුමට කරන ලද යම් වෙනස් කිරීමක් හෝ ආදේශ කිරීමක්, ගිණුම හෝ පුද්ගලික දේපළ පත්‍රය මත වගකීමකට බැඳී සිටින තැනැත්තා විසින් අන්‍යාකාරයකින් එකඟ වී ඇත්නම් මිස, පැවරුම්ලාභියාට එරෙහිව බලාත්මක විය යුතු ය. එසේ වුව ද, පැවරුම්ලාභියා විසින් වෙනස් කරන ලද හෝ ආදේශ කරන ලද ගිවිසුම යටතේ වූ අනුරූප අයිතිවාසිකම් අත්කර ගනු ලැබිය යුතු ය.

(4) අයවිය යුතු හෝ අයවීමට නියමිත මුදල් වෙනුවෙන් සම්පූර්ණ ගිණුම පිළිබඳව ම හෝ සම්පූර්ණ පුද්ගලික දේපළ පත්‍රය පිළිබඳව ම වන සුරකු අයිතිවාසිකමක් පවරාදීම හෝ ලබාදීම තහනම් කරනු ලබන හෝ සීමා කරනු ලබන, නැතහොත් සුරකු අයිතිවාසිකමක් එසේ පවරාදීමට හෝ ලබාදීමට ගිණුම් ණයකරුගේ කැමැත්ත අවශ්‍ය කරන, ගිණුම් ණයකරු සහ පැවරුම්කරු අතර පවතින ගිවිසුමේ යම් නියමයක්-

(අ) එම ගිවිසුම කඩ කිරීම සම්බන්ධයෙන් පැවරුම්කරු ගිණුම් ණයකරු වෙත වගකියනු ලබන තාක් දුරට පමණක් පැවරුම්කරු සම්බන්ධයෙන් බැඳීම් සහගත විය යුතු ය; සහ

(ආ) තුන්වන පාර්ශ්වවලට එරෙහිව බලාත්මක කරනු ලැබිය නොහැකි විය යුතු ය.

(5) මේ වගන්තියේ කාර්යය සඳහා ''ගිණුම් ණයකරු'' යන්නෙන්, යම් ගිණුමක් හෝ පුද්ගලික දේපළ පත්‍රයක් මත වගකීමකට බැඳී සිටින යම් තැනැත්තකු අදහස් වේ.

## VI වන කොටස

## ලියාපදිංචි කිරීම

සුරකුු අයිතිවාසිකම් ලියාපදිංචි කිරීම සහ රෙජිස්ටරය පිහිටුවීම

**48.** (1) අධිකාරිය විසින් චංචල දේපළ පිළිබඳ සුරකුු අයිතිවාසිකම් ලියාපදිංචි කිරීමට අදාළ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, ඉටු කිරීම සහ කිරීම කරනු ලැබිය යුතු ය.

(2) කාර්යාංශය විසින්, මේ පනතේ කාර්යය සඳහා, (මෙහි මින් මතු "රෙජිස්ටරය" යනුවෙන් සඳහන් කරනු ලබන) චංචල දේපළවල සුරකුු අයිතිවාසිකම් පිළිබඳ රෙජිස්ටරය යනුවෙන් හඳුන්වනු ලබන හා සඳහන් කරනු ලබන රෙජිස්ටරයක් පිහිටුවීම, පවත්වාගෙන යාම සහ මෙහෙයවීම සිදු කරනු ලැබිය යුතු ය.

(3) පහත නිශ්චිතව දක්වා ඇති නිර්ණායක එකක් හෝ වැඩි ගණනක් භාවිත කරමින්, පහසුවෙන් සහ කඩිනමින් සෝදිසි කර බැලීම කළ හැකි වන පරිදි රෙජිස්ටරය පවත්වාගෙන යනු ලැබිය යුතු ය:-

(අ) ණයකරුගේ අනන්‍ය හඳුනා ගැනීමේ අංකය භාවිත කිරීමෙන්;

(ආ) මූල්‍යන ප්‍රකාශයේ අංකය භාවිත කිරීමෙන්; හෝ

(ඇ) නියමිත වෙනත් යම් අතිරේක නිර්ණායක භාවිත කිරීමෙන්

සුරකුු අයිතිවාසිකම් ලියාපදිංචි කිරීම සඳහා අයදුම් කිරීම

**49.** (1) මේ පනත යටතේ ලියාපදිංචි කිරීම මගින් යම් සුරකුු අයිතිවාසිකමක් පරිපූර්ණත්වයට පත්වීම සඳහා, නියමිත ආකෘතියෙන් පිළියෙල කරන ලද මූල්‍යන ප්‍රකාශයක් රෙජිස්ට්‍රාර්වරයා වෙත ලියාපදිංචි කරනු ලැබිය යුතු ය.

(2) මූල්‍යන ප්‍රකාශයක් අදාළ වන්නේ යම් සුරකුු ගිවිසුමකට ද එම සුරකුු ගිවිසුම සකස් කර ඇති බව හෝ එම මූල්‍යන ප්‍රකාශය ගොනු කිරීම සඳහා ණයකරු විසින් කැමැත්ත දී ඇති බව මූල්‍යන ප්‍රකාශයක් ගොනු කරනු ලබන තැනැත්තා විසින් තහවුරු කරනු ලැබිය යුතු ය.

(3) (අ) මූල්‍යන ප්‍රකාශයක් සඳහා නියමිත ආකෘතියට අනුකූල නොවන සහ මේ පනතේ විධිවිධාන මගින් හෝ තත්කාර්ය සඳහා සාදනු ලබන අදාළ නියෝග මගින් පනවා ඇති අවශ්‍යතාවලට අනුකූල නොවන යම් මූල්‍යන ප්‍රකාශයක්;

(ආ) නියමිත ගාස්තුව ගෙවා නොමැති හෝ ගොනු කිරීමේ ගාස්තුව ගෙවීම සඳහා යම් වැඩපිළිවෙළක් දක්වා නොමැති යම් මූල්‍යන ප්‍රකාශයක්; හෝ

(ඇ) ඉලෙක්ට්‍රොනික ආකාරයෙන් ලියාපදිංචි කිරීමේ දී සම්පූර්ණ කිරීමට අවශ්‍ය අනිවාර්ය ක්ෂේත්‍ර යථා පරිදි සම්පූර්ණ කර නොමැති යම් මූල්‍යන ප්‍රකාශයක්,

රෙජිස්ට්‍රාර්වරයා විසින් ප්‍රතික්ෂේප කරනු ලැබිය හැකි ය.

මූල්‍යන ප්‍රකාශය

**50.** (1) යම් මූල්‍යන ප්‍රකාශයක්-

(අ) සමපාර්ශ්වීය ද්‍රව්‍ය තුළ පාරිභෝගික භාණ්ඩ අන්තර්ගත වන අවස්ථාවක දී හැර, මූල්‍යන ප්‍රකාශය අදාළ වන සුරකුු ගිවිසුම සකස් කිරීමට පෙර හෝ ඉන් පසුව ගොනු කරනු ලැබිය හැකි ය;

(ආ) සමපාර්ශ්වීය ද්‍රව්‍ය තුළ පාරිභෝගික භාණ්ඩ අන්තර්ගත වන අවස්ථාවක දී හැර, පාර්ශ්ව අතර වූ එක් සුරකුු ගිවිසුමකට වැඩි සුරකුු ගිවිසුම් ප්‍රමාණයක් තුළ ඇති කරන ලද හෝ විධිවිධාන සලසන ලද එක් සුරකුු අයිතිවාසිකමකට වැඩි සුරකුු අයිතිවාසිකම් ප්‍රමාණයකට අදාළ විය හැකි ය; සහ

(ඇ) පහත සඳහන් තොරතුරුවලින් සමන්විත විය යුතු ය. එනම්:-

(i) ණයකරුගේ නම;

(ii) ණයකරුගේ අනන්‍ය හඳුනා ගැනීමේ අංකය;

(iii) සුරක්ෂිතලත් පාර්ශ්වයේ හෝ එහි අනුයෝජිතයාගේ නම සහ ලිපිනය;

(iv) සමපාර්ශ්වීය ද්‍රව්‍ය පිළිබඳව නියමිත ආකාරයෙන් වූ විස්තරයක්;

(v) ගොනු කිරීමේ කාලසීමාව;

(vi) සුරක්ෂිත කරන ලද උපරිම වගකීම් මුදල; සහ

(vii) නියම කරනු ලැබිය හැකි වෙනත් යම් තොරතුරු.

(2) සුරක්ෂිතලත් පාර්ශ්වය භාරකරුවකු ද යන්න පිළිබඳව ද මූල්‍යන ප්‍රකාශයක් මගින් හෙළිදරව් කරනු ලැබිය යුතු ය.

**ලියාපදිංචි කිරීමක් බලාත්මක වන අවස්ථා**

**51.** (1) ගොනු කරන ලද මූල්‍යන ප්‍රකාශයකට රෙජිස්ට්‍රාර්වරයා විසින් දිනයක්, වේලාවක් සහ ("මූල්‍යන ප්‍රකාශ අංකය" යනුවෙන් හඳුන්වනු ලබන) අංකයක් පවරා දෙන අවස්ථාවේ දී, එම මූල්‍යන ප්‍රකාශය ලියාපදිංචි මූල්‍යන ප්‍රකාශයක් බවට පත් වන්නේ ය.

(2) මූල්‍යන ප්‍රකාශයක් ලියාපදිංචි කරනු ලැබූ විට -

(අ) එය නිදහස් කරනු ලබන තෙක්; හෝ

(ආ) එම මූල්‍යන ප්‍රකාශයෙහි ලියාපදිංචිය බලාත්මකව පැවතීම නතර වන දිනයක් එහි නිශ්චිතව දක්වා ඇත්නම් සහ එසේ නිශ්චිතව දක්වා ඇති දිනය වන තෙක් එම ලියාපදිංචිය නිදහස් කර නොමැති නම්, එසේ නිශ්චිතව දක්වා ඇති දිනය තෙක්,

අඛණ්ඩව බලාත්මකව පැවතිය යුතු ය.

**තහවුරු කිරීමේ ප්‍රකාශය**

**52.** (1) මූල්‍යන ප්‍රකාශයක් ලියාපදිංචි කිරීමෙන් පසුව, රෙජිස්ට්‍රාර්වරයා විසින් මූල්‍යන ප්‍රකාශයේ නම සඳහන් සුරක්ෂිතලත් පාර්ශ්වය වෙත හෝ එහි බලයලත් අනුයෝජිතයා වෙත නියමිත සන්නිවේදන ක්‍රමයක් භාවිත කරමින්, නියමිත ආකෘතියෙන් වූ තහවුරු කිරීමේ ප්‍රකාශයක් භාරදෙනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ සඳහන් තහවුරු කිරීමේ ප්‍රකාශයෙහි පහත දැක්වෙන දෑ ඇතුළත් විය යුතු යః-

(අ) මූල්‍යන ප්‍රකාශයේ අන්තර්ගත කරන ලද තොරතුරු;

(ආ) මූල්‍යන ප්‍රකාශයේ අංකය; සහ

(ඇ) මූල්‍යන ප්‍රකාශයේ ලියාපදිංචි කිරීමේ දිනය සහ වේලාව.

**මූල්‍යන ප්‍රකාශයෙහි ඇතුළත් වැරදීම්**

**53.** (1) යම් මූල්‍යන ප්‍රකාශයක් හෙළිදරව් වීම වළක්වනු ලබන පරිදි එම මූල්‍යන ප්‍රකාශයෙහි වැරදි සහගත අනන්‍ය හඳුනා ගැනීමේ අංකයක් අන්තර්ගත වේ නම් එම මූල්‍යන ප්‍රකාශයෙහි ලියාපදිංචිය

අවලංගු විය යුතු ය. එසේ වුව ද, යම් මූල්‍යන ප්‍රකාශයක සඳහන් යම් දෝෂයක් මගින් යම් සාධාරණ තැනැත්තකු සැලකිය යුතු ලෙස නොමග යාමට ඉඩ ඇත්නම් මිස, මූල්‍යන ප්‍රකාශයක සඳහන් යම් දෝෂයක් හේතුවෙන් එහි වලංගුභාවය අන්‍යාකාරයකින් බලපෑමකට ලක් නොවිය යුතු ය.

(2) යම් මූල්‍යන ප්‍රකාශයක යම් සමපාර්ශ්වීය ද්‍රව්‍ය පිළිබඳව විස්තරයක් සැපයීමට අපොහොසත් වීමක් හේතුවෙන්, එම මූල්‍යන ප්‍රකාශයෙහි විස්තර කර ඇති වෙනත් යම් සමපාර්ශ්වීය ද්‍රව්‍යයක් සම්බන්ධයෙන් එම ලියාපදිංචිය නිර්බල නොවිය යුතු ය.

(3) මේ වගන්තියේ කාර්යය සඳහා, “දෝෂය” යන්නට, වැරදි සහගත අනන්‍ය හඳුනා ගැනීමේ අංකයක් හැර, යම් අවිධිමත්භාවයක්, අත්හැරීමක් හෝ වැරදීමක් ඇතුළත් වේ.

*ලියාපදිංචි මූල්‍යන ප්‍රකාශයක් සංශෝධනය කිරීම*

**54.** (1) යම් ලියාපදිංචි මූල්‍යන ප්‍රකාශයක් එහි කාලය අවසන් වීමට පෙරාතුව ඕනෑම අවස්ථාවක සංශෝධන ප්‍රකාශයක් ගොනු කිරීම මගින් සංශෝධනය කරනු ලැබිය හැකි ය.

(2) යම් සංශෝධන ප්‍රකාශයකට රෙජිස්ට්‍රාර්වරයා විසින් දිනයක්, වේලාවක් සහ අංකයක් පවරා දුන් විට එම සංශෝධන ප්‍රකාශය ලියාපදිංචි කරනු ලබන්නේ ය.

*ලියාපදිංචිය දීර්ඝ කිරීම හෝ නිදහස් කිරීම*

**55.** (1) යම් මූල්‍යන ප්‍රකාශයක ලියාපදිංචිය, එහි කාලය අවසන් වීමට පෙරාතුව ඕනෑම අවස්ථාවක සංශෝධන ප්‍රකාශයක් ගොනු කිරීම මගින් දීර්ඝ කිරීම හෝ නිදහස් කිරීම කරනු ලැබිය හැකි ය.

(2) දීර්ඝ කරන ලද යම් ලියාපදිංචි කිරීමක් -

(අ) සංශෝධන ප්‍රකාශයෙහි නිශ්චිතව සඳහන් දිනය තෙක්; හෝ

(ආ) ලියාපදිංචිය නිදහස් කරනු ලබන දිනය තෙක්,

අඛණ්ඩව බලාත්මකව පැවතිය යුතු ය.

(3) ප්‍රමුඛතාව තීරණය කිරීමේ කාර්යය සඳහා, දීර්ඝ කරන ලද ලියාපදිංචි කිරීමක් සඳහා බලාත්මක වන වේලාව සහ දිනය, එහි මුල් ලියාපදිංචියේ වේලාව සහ දිනය විය යුතු ය.

*මූල්‍යන ප්‍රකාශයක් සඳහා වූ සංශෝධනයක් ප්‍රතික්ෂේප කිරීම*

**56.** (1) මේ පනත මගින් හෝ මේ පනත යටතේ සාදන ලද යම් නියෝග මගින් පනවා ඇති අවශ්‍යතා සපුරාලනු නොලබන යම් සංශෝධන ප්‍රකාශයක් රෙජිස්ට්‍රාර්වරයා විසින් ප්‍රතික්ෂේප කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධානවලට අතිරේකව, 49 වන වගන්තියේ (3) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති යම් කවර හෝ හේතුවක් නිසා ද රෙජිස්ට්‍රාර්වරයා විසින් සංශෝධන ප්‍රකාශයක් ප්‍රතික්ෂේප කරනු ලැබිය හැකි ය.

පැවරීම පිළිබඳ දැන්වීම

**57.** (1) සුරකු අයිතිවාසිකමක් සම්බන්ධයෙන් සුරක්ෂිතලත් පාර්ශ්වය විසින් සමපාර්ශ්වීය ද්‍රව්‍යය පිළිබඳ බැඳියාවක් පවරනු ලබන අවස්ථාවක දී, එම පැවරීම හෙළිදරව් කරනු ලබන සංශෝධන ප්‍රකාශයක් ගොනු කරනු ලැබිය හැකි ය.

(2) 2 වන වගන්තියේ නිශ්චිතව දැක්වෙන ගනුදෙනුවකට විෂයය වන සුරකු අයිතිවාසිකමක හෝ ලැබීම්වල පැවරුම්ලාභියකු විසින්, අද්මිනිස්ත්‍රාසිකරුවකුට හෝ ඇවරකරුවකුට හෝ 5 වන වගන්තියේ සඳහන් යම් තැනැත්තකුට එරෙහිව ලියාපදිංචියේ බලාත්මකභාවය අඛණ්ඩව පවත්වා ගැනීම සඳහා සංශෝධන ප්‍රකාශයක් ගොනු කිරීම අවශ්‍ය නොවන්නේ ය.

(3) (1) වන උපවගන්තිය යටතේ සංශෝධන ප්‍රකාශයක් ගොනු කරනු ලබන, එහෙත් සමපාර්ශ්වීය ද්‍රව්‍යයෙහි කොටසක බැඳියාව පවරනු ලබන අවස්ථාවක දී, පවරනු ලබන සමපාර්ශ්වීය ද්‍රව්‍ය කොටස හා සම්බන්ධ බැඳියාව පිළිබඳ විස්තරයක් එම ප්‍රකාශයෙහි ඇතුළත් විය යුතු ය.

(4) සුරකු අයිතිවාසිකමක පැවරීමක් පිළිබඳව හෙළිදරව් කෙරෙන සංශෝධන ප්‍රකාශයක්, පැවරීමට පෙරාතුව හෝ පැවරීමෙන් පසුව ගොනු කරනු ලැබිය හැකි ය.

(5) සංශෝධන ප්‍රකාශයක් ලියාපදිංචි කරනු ලැබූ විට, මේ පනතේ කාර්ය සඳහා පැවරුම්ලාභියා සුරක්ෂිතලත් පාර්ශ්වය ලෙස සලකනු ලැබිය යුතු ය.

(6) සුරක්ෂිතලත් පාර්ශ්වය විසින් පරිපූර්ණ නොවූ සුරකු අයිතිවාසිකමක් සම්බන්ධයෙන් සමපාර්ශ්වීය ද්‍රව්‍ය පිළිබඳ බැඳියාවක් පවරනු ලබන අවස්ථාවක දී මූල්‍යන ප්‍රකාශයක් ගොනු කරනු ලැබිය හැකි අතර, එම පැවරුම්ලාභියා සුරක්ෂිතලත් පාර්ශ්වය වශයෙන් මූල්‍යන ප්‍රකාශයෙහි හෙළිදරව් කරනු ලැබිය යුතු ය.

ද්විතීයික කරනු ලැබීම පිළිබඳ දැන්වීම

**58.**(1) සුරක්ෂිතලත් පාර්ශ්වයක් විසින්, සුරකු අයිතිවාසිකමක් වෙනත් තැනැත්තකුගේ බැඳියාවට ද්විතීයික කරනු ලැබ ඇති අවස්ථාවක දී, එම ද්විතීයික කිරීම හෙළිදරව් කරමින් සංශෝධන ප්‍රකාශයක් ගොනු කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තියේ සඳහන් සංශෝධන ප්‍රකාශයක් සුරකු අයිතිවාසිකමට අදාළ මූල්‍යන ප්‍රකාශයේ ලියාපදිංචියෙහි කාලය අවසන් වීමට පෙරාතුව ගොනු කරනු ලැබිය හැකි ය.

සෝදිසි කිරීම්

**59.** (1) ගාස්තුවක් ගෙවීමට අදාළ යම් අවශ්‍යතාවයක් ද ඇතුළුව, නියමිත යම් කොන්දේසියකට හෝ ව්‍යතිරේකයකට යටත් ව සහ නියමිත යම් ආකාරයකින් යම් තැනැත්තකුට රෙජිස්ටරය සෝදිසි කර බැලිය හැකි ය.

(2) රෙජිස්ට්‍රාර්වරයා විසින් සහතික කරන ලද යම් සෝදිසි කිරීමේ ප්‍රතිඵලයක්, එහි අන්තර්ගත කරුණු පිළිබඳ බැලූබැල්මට පෙනෙන සාක්ෂ්‍ය වශයෙන් යම් අධිකරණයක දී සාක්ෂි ලෙස පිළිගනු ලැබිය හැකි ය.

ණයකරු ආදීන් විසින් සංශෝධන ප්‍රකාශයක් ගොනු කරන ලෙස නියම කරනු ලැබිය හැකි බව

**60.** (1) මූල්‍යන ප්‍රකාශයක් ගොනු කරනු ලැබ ඇති විටෙක සහ පහත දැක්වෙන වගුවේ I වන තීරයේ සඳහන් කොන්දේසිවලින් එක් කොන්දේසියක් සපුරා ඇති විටෙක, ණයකරු හෝ මූල්‍යන ප්‍රකාශයේ සමපාර්ශ්වීය ද්‍රව්‍ය පිළිබඳ විස්තරය තුළට ගැනෙන දේපළ පිළිබඳ යම් බැඳියාවක් ඇති යම් තැනැත්තකු විසින්, මූල්‍යන ප්‍රකාශයේ නම සඳහන් සුරක්ෂිතලත් පාර්ශ්වය වෙත හෝ එහි බලයලත් අනුයෝජිතයා වෙත (මෙහි මින් මතු "අවශ්‍යතා දැන්වීම" යනුවෙන් සඳහන් කරනු ලබන) ලිඛිත දැන්වීමක් ලබා දිය හැකි ය.

(2) අවශ්‍යතා දැන්වීම මගින් -

(අ) සපුරාලනු ලබන කොන්දේසිය කුමක් ද යන්න නිශ්චිතව සඳහන් කරනු ලැබිය යුතු ය;

(ආ) පහත දැක්වෙන වගුවේ I වන තීරයේ දැක්වෙන කොන්දේසියට අනුරූප වන එම වගුවේ II වන තීරයේ දක්වා ඇති බලපෑම නිශ්චිතව දක්වමින්, සංශෝධන ප්‍රකාශයක් ගොනු කරන ලෙස සුරක්ෂිතලත් පාර්ශ්වය වෙත නියම කරනු ලැබිය යුතු ය; සහ

(ඇ) එම අවශ්‍යතා දැන්වීමට අනුකූලව කටයුතු කිරීම පැහැර හරිනු ලැබුවහොත්, එම දැන්වීම දෙන තැනැත්තා විසින් යම් උචිත සංශෝධන ප්‍රකාශයක් ගොනු කිරීමේ ප්‍රතිඵලය ඇති විය හැකි බවට සුරක්ෂිතලත් පාර්ශ්වය වෙත දැනුම් දෙනු ලැබිය යුතු ය.

## වගුව

| *I වන තීරය* | *II වන තීරය* |
|---|---|
| **කොන්දේසිය** | **බලපෑම** |
| මූල්‍යන ප්‍රකාශය අදාළ වන සියලුම සුරකූ ගිවිසුම් යටතේ වූ බැඳීම් ඉටු කර තිබීම. | ලියාපදිංචිය නිදහස් කිරීම |
| මූල්‍යන ප්‍රකාශයෙහි විස්තර කරන ලද සමපාර්ශ්වීය ද්‍රව්‍යවල කොටසක් හෝ සියල්ලම නිදහස් කිරීමට සුරක්ෂිතලත් පාර්ශ්වය එකඟ වී තිබීම. | සුරකූ ගිවිසුමේ නියමයන් නිරූපනය වන පරිදි ලියාපදිංචිය සංශෝධනය කිරීම හෝ නිදහස් කිරීම. |
| මූල්‍යන ප්‍රකාශයේ සමපාර්ශ්වීය ද්‍රව්‍ය පිළිබඳ විස්තරයෙහි සුරක්ෂිතලත් පාර්ශ්වය සහ ණයකරු අතර වූ සුරකූ ගිවිසුමක් යටතේ සමපාර්ශ්වීය ද්‍රව්‍යයක් නොවන්නා වූ යම් අයිතමයක් හෝ යම් දේපළ වර්ගයක් ඇතුළත්ව තිබීම. | සුරක්ෂිතලත් පාර්ශ්වය සහ ණයකරු අතර වූ සුරකූ ගිවිසුම යටතේ සමපාර්ශ්වීය ද්‍රව්‍ය නොවන අයිතම හෝ දේපළ වර්ග බැහැර කිරීම සඳහා සමපාර්ශ්වීය ද්‍රව්‍ය විස්තරය සංශෝධනය කිරීම. |
| සුරක්ෂිතලත් පාර්ශ්වය හා ණයකරු වශයෙන් මූල්‍යන ප්‍රකාශයෙහි නම් සඳහන් තැනැත්තන් අතර කිසිදු සුරකූ ගිවිසුමක් නොතිබීම. | ලියාපදිංචිය නිදහස් කිරීම හෝ ණයකරු පරම ණයකරු නොවන අවස්ථාවක දී, ලියාපදිංචිය සංශෝධනය කිරීම. |

(3) අවශ්‍යතා දැන්වීමක් ලබා දෙන තැනැත්තා පරම ණයකරු නොවන අවස්ථාවක දී, ඔහු විසින් සුරක්ෂිතලත් පාර්ශ්වය වෙත අවශ්‍යතා දැන්වීම නිකුත් කිරීමෙන් වැඩකරන දින පහක් ඇතුළත, මූල්‍යන ප්‍රකාශය අදාළ වන අන් සෑම ණයකරුවකු වෙත ම අවශ්‍යතා දැන්වීමේ පිටපතක් දෙනු ලැබිය යුතු ය.

(4) අවශ්‍යතා දැන්වීම නිකුත් කිරීමෙන් පසුව වැඩකරන දින දහහතරක කාලයක් ඇතුළත සුරක්ෂිතලත් පාර්ශ්වය විසින්-

(අ) එම දැන්වීමට අනුකූලව ක්‍රියා කිරීමට අපොහොසත් වන අවස්ථාවක දී; හෝ

(ආ) (i) අවශ්‍යතා දැන්වීම අදාළ වන ලියාපදිංචි කිරීම පවත්වාගෙන යාම සඳහා ආඥාවක් ලබා ගැනීමට නිසි අධිකරණ බලය සහිත යම් අධිකරණයක දී නඩු කටයුතු ආරම්භ කිරීමට අපොහොසත් වන අවස්ථාවක දී;

(ii) දැන්වීම නිකුත් කරනු ලැබූ තැනැත්තා වෙත දැනුම් දීමට අපොහොසත් වන අවස්ථාවක දී; සහ

(iii) නඩු අංකය සහ නඩු කටයුතු ආරම්භ කිරීමේ දිනය පිළිබඳ තොරතුරු, රෙජිස්ට්‍රාර්වරයා වෙත නියමිත ආකෘතියෙන් ගොනු කිරීමට අපොහොසත්වන අවස්ථාවක දී,

අවශ්‍යතා දැන්වීම නිකුත් කරනු ලැබූ තැනැත්තා විසින්, එම දැන්වීම මගින් ඉල්ලා ඇති පරිදි සංශෝධන ප්‍රකාශයක් ගොනු කරනු ලැබිය හැකි ය.

(5) (4) වන උපවගන්තිය යටතේ ආරම්භ කර ඇති යම් නඩු කටයුත්තක දී, වැඩකරන දින තිහක් ඇතුළත හෝ අධිකරණය විසින් විධාන කරනු ලබන පරිදි වූ යම් දීර්ඝ කරන ලද කාලයක් ඇතුළත යම් ආඥාවක් අධිකරණය විසින් ලබා නොදෙන අවස්ථාවක දී, අවශ්‍යතා දැන්වීම නිකුත් කරන ලද තැනැත්තා විසින් එම දැන්වීම මගින් ඉල්ලා ඇති පරිදි සංශෝධන ප්‍රකාශයක් ගොනු කරනු ලැබිය හැකි ය.

(6) (4) වන සහ (5) වන උපවගන්තිවල සඳහන් විධිවිධාන භාර නඩුවක් කෙරෙහි අදාළ නොවිය යුතු අතර, එවැනි භාර නඩුවක දී, අවශ්‍යතා දැන්වීම නිකුත් කරනු ලබන තැනැත්තකු විසින් තත්කාර්යය සඳහා කරන ලද ඉල්ලීමක් මත නිසි අධිකරණ බලය සහිත අධිකරණයක් විසින්-

(අ) අවශ්‍යතා දැන්වීමේ සඳහන් කොන්දේසිවලින් එක් කොන්දේසියක් හෝ කොන්දේසි වැඩි ප්‍රමාණයක් සපුරා ඇත්නම්; සහ

(ආ) ආඥාව බලාත්මක කිරීමේ කාර්යය සඳහා සුරක්ෂිතලත් පාර්ශ්වය විසින් අවශ්‍යතා දැන්වීමට අනුකූලව ක්‍රියාකර නැත්නම්,

ලියාපදිංචිය සංශෝධනය කරන ලෙස හෝ නිදහස් කරන ලෙස විධාන කරනු ලැබිය හැකි අතර, අධිකරණය විසින් නිකුත් කරනු ලබන එම විධානය බලාත්මක කිරීමේ කාර්යය සඳහා අධිකරණය විසින් උචිත යයි සලකනු ලබන යම් ආඥාවක් කරනු ලැබිය හැකි ය.

(7) මේ වගන්තිය යටතේ නිකුත් කරනු ලැබිය යුතු අවශ්‍යතා දැන්වීමක් නියමිත ආකාරයෙන් නිකුත් කරනු ලැබිය යුතු ය.

(8) මේ වගන්තියේ කාර්යය සඳහා, "භාර නඩුවක්" යන්නෙන්, සුරක්ෂිතලත් පාර්ශ්වය භාරකරුවකු බවට මූල්‍යන ප්‍රකාශය මගින් හෙළිදරව් කෙරෙන යම් නඩුවක් අදහස් වේ.

වැරදි සහගත ගොනු කිරීම් සම්බන්ධයෙන් වන්දි මුදල් ලබා ගැනීමේ හිමිකම

**61.** (1) යම් තැනැත්තකු විසින් සාධාරණ හේතුවක් නොමැතිව-

(අ) ගිවිසුමක් යටතේ සත්‍ය වශයෙන් ම නොපවතින සුරකු අයිතිවාසිකමක් පවතින බව තහවුරු කරමින් මූල්‍යන ප්‍රකාශයක් ගොනු කරනු ලබන අවස්ථාවක දී; හෝ

(ආ) ණයකරු විසින් සත්‍ය වශයෙන් ම මූල්‍යන ප්‍රකාශයක් ගොනු කිරීමට කැමැත්ත ලබා නොදී තිබිය දී එම මූල්‍යන ප්‍රකාශය ගොනු කිරීම සඳහා ණයකරු විසින් කැමැත්ත ලබා දී ඇති බවට තහවුරු කරමින් මූල්‍යන ප්‍රකාශයක් ගොනු කරනු ලබන අවස්ථාවක දී,

එම ගොනු කිරීමේ ප්‍රතිඵලයක් ලෙස උද්ගත වූ බවට සාධාරණ ලෙස පූර්වේක්ෂණය කළ හැකි එම ණයකරුට සිදු වූ යම් පාඩු හෝ අලාභ සඳහා එම තැනැත්තාගෙන් වන්දි මුදල් අයකර ගැනීමට ණයකරුට අයිතියක් තිබිය යුතු ය.

(2) 52 වන වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ තහවුරු කිරීමේ ප්‍රකාශයක් ලැබීමේ දින සිට වැඩ කරන දින දහයක් ඇතුළත එහි පිටපතක් ණයකරු වෙත ඉදිරිපත් කිරීමට සුරක්ෂිතලත් පාර්ශ්වයක් අපොහොසත් වන අවස්ථාවක දී, එම අපොහොසත් වීමේ ප්‍රතිඵලයක් ලෙස උද්ගත වූ බවට සාධාරණ ලෙස පූර්වේක්ෂණය කළ හැකි යම් පාඩු හෝ අලාභ සඳහා එම

තැනැත්තාගෙන් වන්දි මුදල් අයකර ගැනීමට ණයකරුට අයිතියක් තිබිය යුතු ය.

ලැබුම්කරුවකු ආදීන් පත් කිරීම පිළිබඳව අධිකාරිය වෙත දැනුම් දීමේ අවශ්‍යතාවය

**62.**(1) (අ) සමාගමක දේපළ සම්බන්ධයෙන් ලැබුම්කරුවකු හෝ ලැබුම්කරුවකු සහ කළමනාකරුවකු පත් කිරීම සඳහා ආඥාවක් ලබා ගන්නා; හෝ

(ආ) යම් සාධන පත්‍රයක අන්තර්ගත බලතල යටතේ සමාගමක දේපළ සම්බන්ධයෙන් ලැබුම්කරුවකු හෝ ලැබුම්කරුවකු සහ කළමනාකරුවකු පත් කරනු ලබන,

යම් තැනැත්තකු විසින්, එම පත් කිරීම සිදු කිරීමේ සිට දින හතක කාලයක් ඇතුළත එම පත් කිරීම රෙජිස්ට්‍රාර්වරයා වෙත ලියාපදිංචි කරනු ලැබිය යුතු ය.

(2) යම් සාධන පත්‍රයක් ප්‍රකාරව සමාගමක දේපළ සම්බන්ධයෙන් ලැබුම්කරුවකු හෝ ලැබුම්කරුවකු සහ කළමනාකරුවකු ලෙස පත් කරනු ලැබ එසේ කටයුතු කිරීම නතර කරන ලැබුම්කරුවකු හෝ ලැබුම්කරු සහ කළමනාරුවකු විසින් සංශෝධන ප්‍රකාශයක් ගොනු කරනු ලැබිය යුතු ය.

(3) මේ වගන්තිය යටතේ නිකුත් කරනු ලබන දැන්වීමක් නියමිත ආකෘතියෙන් විය යුතු අතර, නියමිත ආකාරයෙන් නිකුත් කරනු ලැබිය යුතු ය.

(4) මේ වගන්තිය මගින් පනවනු ලබන අවශ්‍යතාවලට අනුකූලව ක්‍රියා කිරීම පැහැර හරින යම් තැනැත්තකු වරදක් සිදු කරන අතර, මහෙස්ත්‍රාත් අධිකරණයක් ඉදිරිපිට දී වරදකරු කරනු ලැබීමේ දී රුපියල් ලක්ෂයක් නොඉක්මවන දඩයකට ඒ තැනැත්තා යටත් විය යුතු ය.

මූල්‍යන ප්‍රකාශයක් ගොනු කිරීම මඟින් දැන්වීමක් කිරීම සංයුක්ත නොවන බව

**63.** (1) මූල්‍යන ප්‍රකාශයක් හෝ සංශෝධන ප්‍රකාශයක් ගොනු කිරීම යම් තැනැත්තකු වෙත කරනු ලබන අනුමිත දැන්වීමක් සංයුක්ත කරන ලෙස හෝ එමගින් යම් තැනැත්තකුට එහි පැවැත්ම පිළිබඳව හෝ එහි අන්තර්ගත කරුණු පිළිබඳව සත්‍ය දැනුමක් ඇති වීම සංයුක්ත කරන ලෙස සලකනු නොලැබිය යුතු ය.

(2) සාමාන්‍ය ව්‍යාපාර කටයුතු තුළ දී යම් සමපාර්ශ්වීය ද්‍රව්‍යයක් මිල දී ගනු ලබන යම් ගැනුම්කරුවකු විසින්-

(අ) එම සමපාර්ශ්වීය ද්‍රව්‍යය සෘණභාරයකට යටත් කරනු ලැබ හෝ ඔඩපනය කරනු ලැබ හෝ ලැබුම්කර සම්බන්ධයෙන් වන විට, විකුණනු ලැබ ඇද්ද යන්න පිළිබඳව; හෝ

(ආ) බැහැර කිරීම මගින් සෘණභාරයෙහි නියමයන් උල්ලංඝනය වීමක් සංයුක්ත වන්නේ ද යන්න පිළිබඳව,

විමසා බැලීම අවශ්‍ය නොවිය යුතු ය.

## VII වන කොටස
## පොදු විධිවිධාන

මේ පනතේ විධිවිධාන සමඟ අනනුකූල වීම

**64.** (1) සුරකු ගිවිසුමක් යටතේ පැන නගින අයිතිවාසිකම් හා බැඳීම් පාලනය කරන යම් නීතිමය හෝ සාධාරණත්වය පිළිබඳ මූලධර්ම, මේ පනතේ යම් විධිවිධානයක් සමඟ අනනුකූල වන තාක් දුරට හැර, තවදුරටත් අදාළ විය යුතු ය.

(2) මේ පනත යටතේ හෝ වෙනත් යම් නීතියක් යටතේ සුරකු ගිවිසුමක් තුළින් උද්ගත වන සියලු බැඳීම්, සද්භාවයෙන් සහ වාණිජමය වශයෙන් සාධාරණ අයුරින් ඉටු කිරීම සහ නිදහස් කිරීම කළ යුතු ය.

අලාභ වෙනුවෙන් නඩු කටයුතු

**65.** මේ පනත මඟින් යම් තැනැත්තකු මත පනවනු ලැබ ඇති යම් බැඳීමක් ඉටු කිරීම ඒ තැනැත්තා විසින් සාධාරණ හේතුවක් නොමැතිව පැහැර හරී නම්, ඒ බැඳීම ඉටු කළ යුතුව තිබුණේ යම් තැනැත්තකු වෙත ද, ඒ තැනැත්තාට ඒ පැහැර හැරීම නිසා සිදු වූයේ යයි සාධාරණ ලෙස පූර්වේක්ෂණය කළ හැකි යම් අලාභ හෝ පාඩු වෙනුවෙන් වන්දි ලබා ගැනීමට ඒ තැනැත්තාට අයිතිය තිබිය යුතු ය.

සමපාර්ශ්වීය ද්‍රව්‍යවලට ඇති ප්‍රමුඛතාව සහ හිමිකම් නිශ්චය කිරීමට අධිකරණය සතු බලය

**66.** සමපාර්ශ්වීය ද්‍රව්‍ය පිළිබඳව බැඳියාවක් ඇති තැනැත්තකු විසින් නිසි අධිකරණ බලය ඇති අධිකරණයක් වෙත කරන ලද ඉල්ලීමක් මත, පහත සඳහන් ආඥාවලින් එක් ආඥාවක් හෝ ඒ ආඥා දෙක ම කිරීමට ඒ අධිකරණයට බලය තිබිය යුතු යː-

(අ) සමපාර්ශ්වීය ද්‍රව්‍යවලට ඇති ප්‍රමුඛතාව හෝ හිමිකම හා සම්බන්ධ යම් ප්‍රශ්නයක් තීරණය කිරීමේ ආඥාවක්;

(ආ) මේ පනත මගින් හෝ මේ පනත යටතේ පනවන ලද නියමයන් කිසිවකට අනුකූලව කටයුතු කිරීම සඳහා මේ පනත යටතේ ප්‍රදානය කරන ලද කාලසීමා කොන්දේසි සහිතව හෝ අන්‍යාකාරයකින් දීර්ඝ කිරීමේ හෝ කෙටි කිරීමේ ආඥාවක්.

දැන්වීම් භාර දීම

**67.** මේ පනතේ විධිවිධාන යටතේ භාර දීමට නියම කොට ඇති යම් දැන්වීමක් භාර දීම (101 වන අධිකාරය වූ) සිවිල් නඩු විධාන සංග්‍රහයේ අන්තර්ගත ඒ සම්බන්ධයෙන් වූ අදාළ විධිවිධානවලට අනුකූලව භාර දෙනු ලැබිය යුතු ය.

වෙනත් යම් නීතියක විධිවිධාන සමඟ පරස්පර විරෝධී වීම

**68.** (1) මේ පනතේ අන්‍යාකාරයකින් විශේෂිතව ම විධිවිධාන සලසා ඇති විට දී හැර, මේ පනතේ විධිවිධාන සහ වෙනත් යම් නීතියක විධිවිධාන අතර යම් පරස්පර විරෝධී බවක් ඇති වුවහොත්, මේ පනතේ විධිවිධාන බලපැවැත්විය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධානවල කුමක් සඳහන් වුව ද, මේ පනතේ විධිවිධාන සහ පාරිභෝගිකයන් ආරක්ෂා කිරීම සඳහා විධිවිධාන සලස්වන වෙනත් යම් නීතියක විධිවිධාන අතර පරස්පර විරෝධී බවක් ඇති වුවහොත්, ඒ වෙනත් නීතියේ විධිවිධාන බලපැවැත්විය යුතු ය.

සාමාජිකයන්, රෙජිස්ට්‍රාර්වරයා සහ නිලධරයන් සහ සේවා නියුක්තයන් රජයේ සේවකයන් ලෙස සලකනු ලැබිය යුතු බව

**69.** මණ්ඩලයේ සාමාජිකයන් සහ අධිකාරියේ රෙජිස්ට්‍රාර්වරයා සහ අනෙකුත් නිලධරයන් සහ සේවානියුක්තයන් (19 වන අධිකාරය වූ) දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථානුකූලව සහ ඒ සංග්‍රහයේ කාර්ය සඳහා රජයේ සේවකයන් ලෙස සලකනු ලැබිය යුතු ය.

අධිකාරිය, උපලේඛනගත ආයතනයක් ලෙස සලකනු ලැබිය යුතු බව

**70.** අධිකාරිය, 2023 අංක 9 දරන දූෂණ විරෝධී පනතේ අර්ථානුකූලව සහ ඒ පනතේ කාර්ය සඳහා උපලේඛනගත ආයතනයක් ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ පනතේ විධිවිධාන ඒ අනුව තේරුම් ගනු ලැබිය යුතු ය.

*වියදම්, අධිකාරියේ අරමුදලින් ගෙවිය යුතු බව*

**71.** (1) යම් අධිකරණයක් ඉදිරියෙහි, අධිකාරිය විසින් හෝ අධිකාරියට විරුද්ධව පවරනු ලැබූ යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී අධිකාරිය විසින් දරන ලද සියලු වියදම් අධිකාරියේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු අතර, එවැනි යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී අධිකාරියට ගෙවන ලද හෝ අධිකාරිය විසින් අයකර ගන්නා ලද යම් ගාස්තු අධිකාරියේ අරමුදලට බැර කරනු ලැබිය යුතු ය.

(2) අවස්ථාවෝචිත පරිදි, මේ පනත යටතේ හෝ මණ්ඩලය විසින් නිකුත් කරන ලද යම් විධානයක් මත මණ්ඩලයේ සාමාජිකයකු විසින් හෝ අධිකාරියේ රෙජිස්ට්‍රාර්වරයා හෝ යම් නිලධරයකු හෝ සේවානියුක්තයකු විසින් කරන ලද හෝ කරන ලදැයි කියනු ලබන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් යම් අධිකරණයක් ඉදිරියෙහි ඒ තැනැත්තා විසින් හෝ ඒ තැනැත්තාට විරුද්ධව පවරනු ලැබූ යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී ඒ තැනැත්තා විසින් දරන ලද යම් වියදම්, ඒ ක්‍රියාව සද්භාවයෙන් කරන ලදැයි අධිකරණය තීරණය කරන්නේ නම්, ඒ වියදම් ඔහු විසින් ඒ සිවිල් හෝ අපරාධ නඩුවේ දී අයකර ගනු ලැබුවේ නම් මිස, අධිකාරියේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

*නියෝග*

**72.** (1) අමාත්‍යවරයා විසින් නියම කළ යුතු යයි මේ පනතින් නියමිත හෝ නියෝග සාදනු ලැබිය යුතු බවට මේ පනත මඟින් බලය දී ඇති හෝ යම් කාරණයක් සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් කලින් කල නියෝග සාදනු ලැබිය හැකි ය.

(2) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු අතර, එය එසේ පළ කරනු ලැබූ දින සිට හෝ ඒ නියෝගයේ නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි පරිදි යම් පසු දිනයක සිට හෝ ක්‍රියාත්මක විය යුතු ය.

(3) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයේ පළ කිරීමෙන් පසුව, මාස තුනක් ඇතුළත අනුමතය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(4) එසේ අනුමත කරනු නොලැබූ යම් නියෝගයක්, ඒ නියෝගය යටතේ යථා පරිදි සිදු කරන ලද කිසිවකට අගතියක් නොමැතිව, ඒ අනනුමතයේ දින සිට පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය.

(5) අමාත්‍යවරයා විසින් සාදන ලද යම් නියෝගයක් එසේ පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලබන දිනය පිළිබඳ නිවේදනය, ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය.

*රීති*

**73.** (1) අධිකාරිය විසින්, මේ පනත යටතේ රීති සාදනු ලැබීමට බලය දෙනු ලැබ ඇති හෝ නියම කොට ඇති හෝ අධිකාරියේ පරමාර්ථ ඉටුකර ගැනීමේ කාර්යය සඳහා අවශ්‍ය යයි අධිකාරිය විසින් සලකනු ලබන කාරණා සම්බන්ධයෙන් රීති සාදනු ලැබිය හැකි ය.

(2) විශේෂයෙන් ම සහ (1) වන උපවගන්තිය මඟින් පවරන ලද බලතලවල ව්‍යාප්තියට හානියක් නොමැතිව, අධිකාරිය විසින් පහත දැක්වෙන කාරණා සම්බන්ධයෙන් රීති සාදනු ලැබිය හැකි යː-

(ඇ) සුරකු අයිතිවාසිකම් ලියාපදිංචි කිරීම සහ විනිශ්චිත ණයහිමියන් ලියාපදිංචි කිරීම සඳහා අයදුම් කරන ආකාරය සහ අයදුම් කිරීමේ පිළිවෙළ පිළිබඳව; සහ

(ඈ) අධිකාරිය විසින් සලසනු ලබන සේවා සම්බන්ධයෙන් අය කරනු ලැබිය යුතු ගාස්තු හෝ අය කරනු ලැබිය යුතු ගෙවීම් පිළිබඳව.

(3) (1) වන උපවගන්තිය යටතේ අධිකාරිය විසින් සාදනු ලබන රීති සියල්ලක් ම අමාත්‍යවරයා විසින් අනුමත කළ යුතු අතර, ඉන්පසුව ඒවා ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය.

## VIII වන කොටස

### ඉවත් කිරීම් සහ ඉතිරි කිරීම්

**ඉවත් කිරීම සහ ඉතිරි කිරීම්**

**74.** (1) (මෙහි මින් මතු "ඉවත් කරන ලද පනත" යනුවෙන් සඳහන් කරනු ලබන) 2009 අංක 49 දරන සුරක්ෂිතලත් ගනුදෙනු පනත මෙයින් ඉවත් කරනු ලැබේ.

(2) ඉවත් කරන ලද පනත ඉවත් කිරීම නොතකා -

(ඇ) ඉවත් කරන ලද පනත යටතේ ලියාපදිංචි කරන ලද සහ නියමිත දිනයට පෙරාතුව ම වූ දිනයේ දී පැවති යම් සුරකු අයිතිවාසිකමක්, මේ පනතේ 4 වන වගන්තියේ (ආ) ඡේදයේ නිශ්චිතව දක්වා ඇති අවශ්‍යතා සපුරාලීමේ කාර්යය සඳහා වලංගු සුරකු අයිතිවාසිකමක් ලෙස තවදුරටත් පැවතිය යුතු ය; සහ

(ඈ) 2023 අංක දරන ලේඛන ලියාපදිංචි කිරීමේ (සංශෝධන) පනතේ 9 වන වගන්තිය ප්‍රකාරව මේ පනත යටතේ ලියාපදිංචි කරනු ලැබ ඇති -

(i) චංචල දේපළ පිළිබඳ ඔඩපනයක්, උකසක් හෝ විකුණුම් බිල් පත්‍රයක්; හෝ

(ii) (ඇ) යම් නිශ්චල දේපළක සවිකිරීමක් හා සම්බන්ධ යම් බැඳියාවක්; හෝ

(ආ) යම් නිශ්චල දේපළක උකසක්, ඍණ භාරයක් හෝ බද්දක් යටතේ වන ගෙවීමකට ඇති අයිතිය පවරාදීමේ දී, ඒ පවරා දීම මගින් යම් නිශ්චල දේපළක් කෙරෙහි වන පැවරුම්කරුගේ බැඳියාව භාරදීම හෝ පැවරීම සිදු නොවන අවස්ථාවක, එවැනි පවරා දීමක්,

ඇති කරන යම් සාධන පත්‍රයක් සම්බන්ධයෙන් ඉවත් කරන ලද පනත යටතේ පවරනු ලැබ ඇති සහ නියමිත දිනයට පෙරාතුව ම වූ දිනයේ දී අවසන් නොවී පවත්නා යම් සිවිල් හෝ අපරාධ නඩු කටයුත්තක් මේ පනත යටතේ පවරනු ලැබ ඇති නඩු කටයුත්තක් ලෙස සලකනු ලැබිය යුතු ය.

## IX වන කොටස

## අර්ථ නිරූපනය

**75.**(1) පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතෙහි- අර්ථ නිරූපනය

"එක්කිරීම්" යන්නෙන්, වෙනත් භාණ්ඩවලට සවි කරනු ලබන හෝ යා කරනු ලබන භාණ්ඩ අදහස් වේ;

"ගිණුම" යන්නෙන්, වගකීම උද්ගත වූයේ ඉටු කිරීම මගින් වුව ද නොවූව ද යන්න නොසලකා පුද්ගලික දේපළ පත්‍රයක්, සුරැකුමක් හෝ සාධන පත්‍රයක් මගින් සනාථ නොකෙරන මූල්‍යමය වගකීමක් අදහස් වේ;

"අත්කර ගැනීමේ සුරකු අයිතිවාසිකම" යන්නෙන්-

(අ) සමපාර්ශ්වීය ද්‍රව්‍යයේ සම්පූර්ණ මිල හෝ ඉන් කොටසක මිල ගෙවීම සුරක්ෂිත කිරීම සඳහා එම සමපාර්ශ්වීය ද්‍රව්‍යය සම්බන්ධයෙන් ගනු ලැබූ හෝ වෙන් කරනු ලැබූ සුරකු අයිතිවාසිකමක්;

(ආ) සමපාර්ශ්වීය ද්‍රව්‍යයක් පිළිබඳ අයිතිවාසිකම් අත්කර ගැනීමට ණයකරුට හැකි වනු පිණිස යම් තැනැත්තකු විසින් දෙනු ලබන වටිනාකම ඒ අයිතිවාසිකම් අත්කර ගැනීමට අදාළ කර ගන්නා ප්‍රමාණය තෙක් වන,

ඒ තැනැත්තා විසින් ඒ සමපාර්ශ්වීය ද්‍රව්‍යය සම්බන්ධයෙන් ගනු ලැබූ සුරකු අයිතිවාසිකමක්; හෝ

(ඇ) අවුරුදු එකකට වැඩි කාලසීමාවක් සඳහා වූ බද්දක් යටතේ වන භාණ්ඩවල බදු දීමනාකරුවකුගේ බැඳියාව,

අදහස් වන අතර, එහෙත් ඊට විකුණුම්කරු විසින් කරන විකිණීමේ ගනුදෙනුවක් සහ විකුණුම්කරුට ආපසු බදුදීමේ ගනුදෙනුවක් ඇතුළත් නොවේ;

"සංශෝධන ප්‍රකාශය" යන්නෙන්, මේ පනත මගින් සහ මේ පනත යටතේ සාදන ලද යම් නියෝගවලින් පනවන ලද නියමයන් සපුරාලන සහ මේ පනතේ 54 වන, 55 වන, 57 වන, 58 වන හෝ 60 වන වගන්තිය යටතේ සුරක්ෂිතලත් පාර්ශ්වය විසින් හෝ සුරක්ෂිතලත් පාර්ශ්වයේ අනුයෝජිතයා විසින් ගොනු කරනු ලබන ප්‍රකාශයක් අදහස් වේ;

"කාර්යාංශය" යන්නෙන්, 1990 අංක 18 දරන ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශය පනත මගින් පිහිටුවන ලද ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශය අදහස් වේ;

"සහතික කරන ලද සුරැකුම" යන්නෙන් -

(අ) සුරැකුම්වලට හිමිකම් ලබන තැනැත්තා සහතිකයේ සන්තකය දරන තැනැත්තා බවට විධිවිධාන සලස්වන; හෝ

(ආ) සුරැකුම්වලට හිමිකම් ලබන තැනැත්තා කවරකු දැයි හඳුන්වා දෙන,

සහතිකයක් මගින් නියෝජනය වන්නා වූ සුරැකුමක් අදහස් වේ;

"පුද්ගලික දේපළ පත්‍රය" යන්නෙන්, විශේෂිත භාණ්ඩ පිළිබඳ හෝ විශේෂිත භාණ්ඩ බදු දීමක් පිළිබඳ මූල්‍යමය වගකීමක් සහ සුරකු අයිතිවාසිකමක් යන දෙක ම පිළිබඳව සාක්ෂි දරන ලිඛිතව වූ ලියවිල්ලක් අදහස් වේ;

"සමපාර්ශ්වීය ද්‍රව්‍ය" යන්නෙන්, සුරකු අයිතිවාසිකමකට යටත් යම් චංචල දේපළක් අදහස් වේ;

"වාණිජමය වශයෙන් සාධාරණ" යන්නෙන්, පවතින අවස්ථානුගත කරුණු සැලකිල්ලට ගනිමින් සමපාර්ශ්වීය ද්‍රව්‍ය සඳහා හොඳම වෙළෙඳපළ මිල ලබා ගැනීමේ අදහසින්, පවතින අවස්ථානුගත කරුණු අනුව සාධාරණ යයි සලකනු ලැබිය හැකි තත්ත්වයන් යටතේ සමපාර්ශ්වීය ද්‍රව්‍යයක් බැහැර කිරීමේ යම් කාර්ය පටිපාටියක් අදාළ කර ගැනීම අදහස් වේ;

"පාරිභෝගික භාණ්ඩ" යන්නෙන්, මූලිකව ම පරිභෝජනය සඳහා හෝ යම් ගෘහස්ථමය කාර්යයක් සඳහා භාවිත කරන හෝ අත්කර ගනු ලබන භාණ්ඩ අදහස් වේ;

"ණයකරු" යන්නෙන් -

(අ) ගෙවීමක් කිරීමට හෝ සුරක්ෂිත කරන ලද වගකීමක් ඉටු කිරීමට බැඳී සිටින්නා වූ ද සහ සමපාර්ශ්වීය ද්‍රව්‍යවල හිමිකාරිත්වය දරන්නා වූ හෝ සමපාර්ශ්වීය ද්‍රව්‍යවලට අයිතිවාසිකම් ඇත්තා වූ ද තැනැත්තකු;

(ආ) කුලීපිට ගැනුම් ගිවිසුමක් යටතේ වූ ගැනුම්කරුවකු හෝ අවුරුදු එකකට වැඩි කාලසීමාවක් සඳහා වූ බද්දක් යටතේ වූ බදු ගැනුම්කරුවකු;

(ඇ) හිමිකම රඳවා ගැනීමේ වගන්තියකට යටත්ව හෝ කොන්දේසි සහිත විකිණීමක් යටතේ භාණ්ඩ අත්කර ගන්නා ගැනුම්කරුවකු; සහ

(ඈ) ගිණුමක හෝ පුද්ගලික දේපළ පත්‍රයක පැවරුම් කරුවකු,

අදහස් වන අතර, පද සම්බන්ධය අනුව යම් සමපාර්ශ්වීය ද්‍රව්‍ය කෙරෙහි ණයකරුවකු සතු බැඳියාවක පැවරුම්ලාභියකු ද ඊට ඇතුළත් කළ හැකි අවස්ථාවක, ඒ පැවරුම්ලාභියකු ද ඊට ඇතුළත් වේ;

"පැහැර හැරීම" යන්නෙන් -

(අ) සුරක්ෂිත කරන ලද වගකීම නියමිත පරිදි ගෙවීමට හෝ අන්‍යාකාරයකින් ඉටු කිරීමට අපොහොසත් වීම; හෝ

(ආ) සුරකු ගිවිසුමක නියමයන් යටතේ, සුරකු අයිතිවාසිකම බලාත්මක කළ හැකි යම් සිද්ධියක් හෝ අවස්ථානුගත තත්ත්වයන් කිහිපයක් සිදුවීම,

අදහස් වේ;

"වටිනාකම අඩුවීම" යන්නෙන්, අලාභයක් සිදු වී ඇත්තේ යම් දේපළකට ද ඒ දේපළේ අලාභය සිදු වීමට පෙර වටිනාකම සහ පසු වටිනාකම අතර වෙනස අදහස් වේ;

"හිමිකම් ලේඛනය" යන්නෙන් -

(අ) උපනිධායකයාගේ සන්තකයේ ඇති හඳුනා ගත හැකි භාණ්ඩ හෝ හඳුනාගත හැකි භාණ්ඩ සමූහයක් තුළ ඇති සමජාතීය භාණ්ඩ කොටස ආවරණය කරන; සහ

(ආ) සාමාන්‍ය ව්‍යාපාර කටයුතුවල දී, ලියවිල්ල සහ ඒ ලියවිල්ලෙන් ආවරණය වන භාණ්ඩ ලැබීමට, දැරීමට සහ බැහැර කිරීමට ඒ ලියවිල්ලෙහි සන්තකය දරන තැනැත්තා හිමිකම් ලබන බැව් තහවුරු කරන්නේ යයි සලකනු ලබන,

උපනිධායකයකු විසින් නිකුත් කරනු ලබන හෝ උපනිධායකයකු අමතා යවනු ලබන ලියවිල්ලක් අදහස් වේ;

"උපකරණ" යන්නෙන්, බඩු තොගයක් නොවන හෝ පාරිභෝගික භාණ්ඩ නොවන හෝ භාණ්ඩ අදහස් වේ;

"මූල්‍යන ප්‍රකාශය" යන්නෙන්, 50 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ඇ) ඡේදය යටතේ නියම කරන ලද තොරතුරු වලින් සමන්විත වන ප්‍රකාශයක් අදහස් වන අතර, පද සම්බන්ධය අනුව ඇතුළත් කළ හැකි අවස්ථාවක, සංශෝධන ප්‍රකාශයක් ද, (117 වන අධිකාරය වූ) ලේඛන ලියාපදිංචි කිරීමේ ආඥාපනත යටතේ ලියාපදිංචි කරන ලද ලේඛනයක් ද සහ ඒ ලියාපදිංචිය නිවැරදි කිරීමට, සංශෝධනය කිරීමට හෝ අලුත් කිරීමට ඒ සමඟ ඉදිරිපත් කරන හෝ ලියාපදිංචි කරන ලද යම් ලියවිල්ලක් ද ඊට ඇතුළත් වේ;

"සමජාතීය සමපාර්ශ්වීය ද්‍රව්‍ය" යන්නෙන්, සමාන ස්වභාවයක හෝ සමාන වර්ගයක වූ වෙනත් භාණ්ඩයක් සඳහා සම්පූර්ණයෙන් ම හෝ කොටසක් වශයෙන් නිදහසේ හුවමාරු කළ හැකි හෝ ප්‍රතියෝජනය කළ හැකි ස්වභාවයක හෝ වර්ගයක වූ භාණ්ඩ අදහස් වේ;

"අනාගත අත්තිකාරම" යන්නෙන්, අත්තිකාරම ගෙවන ලද්දේ පොරොන්දුවක් ප්‍රකාරව වුව ද නොවූව ද, සුරකුම් ගිවිසුමක් මගින් සුරක්ෂිත කරන ලද යම් මුදලක, ණයක හෝ වෙනත් වටිනාකමක අත්තිකාරමක් අදහස් වේ;

"භාණ්ඩ" යන්නෙන්, පුද්ගලික දේපළ පත්‍ර, හිමිකම් ලේඛන, සාධන පත්‍ර, මුදල් සහ ආයෝජන දේපළ නොවන චංචල දේපළ අදහස් වන අතර, ඊට සවිකිරීම්, වැවෙන බෝග, නූපන් සත්ව පැටව්, කැපීමට ඇති දැව සහ කැණීමට ඇති ඛනිජ ද්‍රව්‍ය සහ හයිඩ්‍රොකාබන් ඇතුළත් වේ;

"සාධන පත්‍රය" යන්නෙන් -

(අ) (82 වන අධිකාරය වූ) විනිමය බිල්පත් ආඥාපනතේ අර්ථානුකූලව විනිමය බිල්පතක්, පොරොන්දු නෝට්ටුවක් හෝ චෙක්පතක්;

(ආ) ණයවර ලිපියක් හෝ ණය අත්තිකාරම් ලිපියක් යටතේ ගෙවීම ඉල්ලා සිටින විට ඒ ලිපිය භාර දෙනු ලැබිය යුතු යයි එහි සඳහන් වන්නේ නම්, ඒ ණයවර ලිපියක් හෝ ණය අත්තිකාරම් ලිපියක්; සහ

(ඇ) මුදල් ගෙවීමක් සම්බන්ධයෙන් ඇති අයිතියක් තහවුරු කෙරෙන සහ සාමාන්‍ය ව්‍යාපාර කටයුතුවල දී අවශ්‍ය වන යම් පිටසනක් හෝ පැවරුමක් සමඟ භාරදීම මඟින් පැවරීම සිදු කෙරෙන ස්වරූපයක වන වෙනත් යම් ලියවිල්ලක්,

අදහස් වන නමුදු, ඊට පුද්ගලික දේපළ පත්‍රයක, හිමිකම් ලේඛනයක, සාධන පත්‍රයක, මුදල් හෝ ආයෝජන දේපළක කොටසක් සංස්ථාපනය වන්නා වූ ලියවිල්ලක් ඇතුළත් නොවේ;

"අස්පර්ශනීය" යන්නෙන්, පුද්ගලික දේපළ පත්‍ර, හිමිකම් ලේඛන, සාධන පත්‍ර, මුදල් හෝ ආයෝජන දේපළ ඇතුළු භාණ්ඩ නොවන චංචල දේපළ අදහස් වේ;

"බඩු තොග" යන්නෙන් -

(අ) විකිණීම සඳහා හෝ බදු දීම සඳහා යම් තැනැත්තකු විසින් දරනු ලබන භාණ්ඩ හෝ ඒ තැනැත්තා විසින් බදු දීමනාකරුවකු ලෙස බද්දට දෙනු ලැබ ඇති භාණ්ඩ;

(ආ) කොන්ත්‍රාත්තුවක් හෝ සේවාවක් යටතේ සැපයීමට ඇති හෝ සපයනු ලැබ ඇති භාණ්ඩ;

(ඇ) අමුද්‍රව්‍ය හෝ අර්ධ නිමි භාණ්ඩ; හෝ

(ඈ) යම් ව්‍යාපාරයක හෝ වෘත්තියක භාවිත කරනු ලබන හෝ පරිභෝජනය කරනු ලබන ද්‍රව්‍ය වන භාණ්ඩ,

අදහස් වේ;

"අවුරුදු එකකට වැඩි කාලසීමාවක් සඳහා වූ බද්ද" යන්නට, එකම වත්කම සම්බන්ධයෙන් මුළු බදු කාල පරිච්ඡේදය එක් වසරක් ඉක්මවන්නා වූ කෙටි කාලීන බදු දීම් මාලාවක් ඇතුළත් වන නමුදු ඊට -

(අ) භාණ්ඩ බදු දීමේ ව්‍යාපාරයේ නිතිපතා නිරතව නො සිටින බදු දීමනාකරුවකු විසින් භාණ්ඩ බද්දට දීමක්;

(ආ) නිශ්චල දේපළක් භාවිත කිරීමට සහ භුක්ති විඳීමට භාණ්ඩ ආනුෂංගික වන අවස්ථාවක දී, නිශ්චල දේපළ බදු දීමක කොටසක් ලෙස ගෘහ භාණ්ඩ හෝ ගෘහ උපකරණ බද්දට දීමක්; හෝ

(ඇ) බදු කාලසීමාවේ ප්‍රමාණය නොසලකා, නියමිත වර්ගයක භාණ්ඩ බද්දට දීමක්,

ඇතුළත් නොවේ;

"ඛනිජ ද්‍රව්‍ය" යන්නට, තෙල්, ගෑස් සහ හයිඩ්‍රොකාබන් ඇතුළත් වේ;

"අමාත්‍යවරයා" යන්නෙන්, මෙම පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ කාර්යය පවරනු ලැබ ඇති අමාත්‍යවරයා අදහස් වේ;

"චංචල දේපළ" යන්නෙන් -

(අ) භාණ්ඩ, හිමිකම් ලේඛනයක්, පුද්ගලික දේපළ පත්‍රයක්, සුරැකුමක්, සාධන පත්‍රයක්, මුදල් හෝ යම් අස්පර්ශනීය දේපළක්; හෝ

(ආ) (i) යම් නිශ්චල දේපළක සවිකිරීමක් හා සම්බන්ධ බැඳියාවක්; හෝ

(ii) යම් නිශ්චල දේපළක උකසක්, ඍණ භාරයක් හෝ බද්දක් යටතේ වන ගෙවීමකට ඇති අයිතිය පවරාදීමේ දී, ඒ පවරාදීම මගින් යම් නිශ්චල දේපළක් කෙරෙහි වන පැවරුම්කරුගේ බැඳියාව භාරදීම හෝ පැවරීම සිදු නොවන අවස්ථාවක, එවැනි පවරාදීමක්,

අදහස් වේ;

"වෙනස් වීම් පිළිබඳ දැන්වීම" යන්නෙන්, මූල්‍යන ප්‍රකාශයක් නිදහස් කිරීම හෝ අන්‍යාකාරයකින් සංශෝධනය කිරීම පිණිස කාර්යාංශය වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු, යම් නියමිත ආකෘතියක ඇතුළත් කර ඇති දත්ත අදහස් වේ;

"නඩු තීන්දුව පිළිබඳ දැන්වීම" සහ "හිමිකම් පෑමේ දැන්වීම" යන්නෙන්, මේ පනත යටතේ ලියාපදිංචි කිරීමක් සිදු කිරීම සඳහා අධිකාරියේ ලියාපදිංචි වීමට අවශ්‍ය කරන යම් නියමිත ආකෘතියක වූ දත්ත අදහස් වන අතර, පද සම්බන්ධය අනුව ඇතුළත් කළ හැකි අවස්ථාවක, ඒ ලියාපදිංචි කිරීම සංශෝධනය කිරීමට, අලුත් කිරීමට හෝ නිදහස් කිරීමට බලය දෙනු ලබන දත්ත ද ඊට ඇතුළත් වේ;

"සුරක්ෂිත කරන ලද වගකීම" යන්නෙන්, ගෙවීමක් සුරක්ෂිත කරන හෝ වගකීමක් ඉටු කිරීම සුරක්ෂිත කරන බද්දක් යටතේ ගෙවිය යුතු මුදල නිශ්චය කිරීමේ කාර්යය සඳහා වන විට-

(අ) බද්ද යටතේ කුලිය ලෙස ගෙවීමට මුලින් ම ගිවිස ගත් මුදල; සහ

(ආ) සමපාර්ශ්වීය ද්‍රව්‍යවල හිමිකාරත්වය ලබා ගැනීම පිණිස බදු ගැනුම්කරු විසින් ගෙවනු ලැබිය යුතු මුදලක් වෙතොත් ඒ මුදල ඇතුළත් ව සහ දැනට ගෙවා ඇති මුදල් ප්‍රමාණය අඩු කළ පසුව, බද්දේ කොන්දේසි යටතේ ගෙවිය යුතු අන් සියලු මුදල් ප්‍රමාණ,

අදහස් වේ;

"බඩු උගස්ගන්නකු" යන්නට, (90 වන අධිකාරය වූ) බඩු උගස්ගන්නන්ගේ ආඥාපනතේ ඒ පදයට දී ඇති අර්ථය ම තිබිය යුතු ය;

"ඔඩපනකරු" යන්නෙන්, ඔඩපනයක් පිට හෝ උකසක් සඳහා බඩු උගස්ගන්නකු වෙත භාණ්ඩ භාර දෙන තැනැත්තකු අදහස් වේ;

"නියමිත" යන්නෙන්, මේ පනත යටතේ සාදනු ලබන නියෝග මගින් නියමිත යන්න අදහස් වේ;

"ලාභ" යන්නෙන්, සමපාර්ශ්වීය ද්‍රව්‍ය හෝ සමපාර්ශ්වීය ද්‍රව්‍යවලින් ලද ලාභ සම්බන්ධයෙන් සිදු කරන යම් ගනුදෙනුවකින් ඍජුව හෝ වක්‍රව උපයන ලද, හඳුනාගත හැකි හෝ අනාවරණය කර ගත හැකි ඕනෑම ආකාරයක වූ චංචල දේපළ අදහස් වන අතර, ඊට -

(අ) රක්ෂණ ගෙවීමකට හෝ ඉන් ඇති වන ලාභවලට ඇති අයිතිවාසිකමක් ද ඇතුළත්ව, සමපාර්ශ්වීය ද්‍රව්‍යවලට සිදු වන පාඩුවක් හෝ අලාභයක් සඳහා වන හානිපූර්ණයක් හෝ වන්දියක් නියෝජනය කරන යම් ගෙවීමක්; සහ

(ආ) පුද්ගලික දේපළ පත්‍රයක්, සාධන පත්‍රයක් හෝ යම් අස්පර්ශනීය දේපළක් සම්පූර්ණයෙන් ම හෝ අර්ධ වශයෙන් නිදහස් කර ගැනීමේ දී හෝ බේරා ගැනීමේ දී කරනු ලබන යම් ගෙවීමක්,

ඇතුළත් වේ;

"මිල දී ගැනීම" යන්නට, විකිණීමෙන්, බද්දට ගැනීමෙන්, උකස් කිරීමෙන්, ඔඩපනය කිරීමෙන් හෝ කැප අයිතිය මගින්, ත්‍යාග මගින් හෝ චංචල දේපළකට බැඳියාවක් ඇති කරන වෙනත් යම් ඒකමතික ගනුදෙනුවක් මගින් ලබා ගැනීම ඇතුළත් වේ;

"ලැබුම්කරුවකු" යන්නට, ලැබුම්කරුවකු සහ කළමනාකරුවකු ද ඇතුළත් වේ;

"ලියාපදිංචි කරන ලද බැඳියාව" යන්නෙන්, නිසි බලධරයකු වෙත ලියාපදිංචි කර ඇති, නිශ්චල දේපළ පිළිබඳ අයිතියක් අදහස් වේ;

"සුරක්ෂිතලත් පාර්ශ්වය" යන්නෙන් -

(අ) තමන්ගේ ම අර්ථලාභය සඳහා සුරකු අයිතිවාසිකමක් දරන්නේ යම් තැනැත්තකු ද ඒ තැනැත්තා;

(ආ) වෙනත් යම් තැනැත්තකුගේ අර්ථලාභය සඳහා සුරකු අයිතිවාසිකමක් දරන්නේ යම් තැනැත්තකු ද ඒ තැනැත්තා;

(ඇ) භාර ප්‍රතිඥාපත්‍රයෙහි සුරකු අයිතිවාසිකමක් අන්තර්ගත කර ඇත්නම්, භාරකරුවකු,

අදහස් වන අතර,

(ඈ) පද සම්බන්ධය අනුව ඇතුළත් කළ හැකි අවස්ථාවක, ලැබුම්කරුවකු ද ඊට ඇතුළත් වේ;

"සුරකු ගිවිසුම" යන්නෙන්, සුරකු අයිතිවාසිකමක් ඇති කරන හෝ සුරකු අයිතිවාසිකමක් සඳහා විධිවිධාන සලසන ගිවිසුමක් අදහස් වන අතර, සුරකු අයිතිවාසිකමකට සාක්ෂි දරන ලියවිල්ලක් ද ඊට ඇතුළත් වේ;

"සුරකු අයිතිවාසිකම" යන්නෙන්, ගෙවීමක් සුරක්ෂිත කරන හෝ වගකීමක් ඉටු කිරීම සුරක්ෂිත කරන, චංචල දේපළ පිළිබඳ බැඳියාවක් අදහස් වන අතර, එම බැඳියාව මගින් ගෙවීමක් හෝ වගකීමක් ඉටු කිරීම සුරක්ෂිත කළ ද නොකළ ද, ඊට -

(අ) අවුරුදු එකකට වැඩි කාලසීමාවක් සඳහා වූ බද්දක් යටතේ බදු දීමනාකරුවකුගේ බැඳියාව; සහ

(ආ) ගිණුමක හෝ පුද්ගලික දේපළ පත්‍රයක පැවරුම්ලාභියකුගේ බැඳියාව,

ද ඇතුළත් වේ;

"භාර ප්‍රතිඥාපත්‍රය" යන්නෙන්, කොටස් ප්‍රාග්ධනයක් ඇතිව හෝ නැතිව සහ කවර ස්ථානයක හෝ කෙසේ සංස්ථාගත කරනු ලැබුවේ වුව ද යම් පුද්ගල මණ්ඩලයක් විසින්, ණය වගකීම් නිකුත් කිරීමට හෝ ණය වගකීම්වලට ඇපවීමට හෝ එසේ ණය වගකීම් නිකුත් කිරීම සඳහා හෝ ණය වගකීම්වලට ඇපවීම සඳහා විධිවිධාන සලස්වන සහ එසේ නිකුත් කරන ලද, ඇප වූ හෝ විධිවිධාන සලස්වන ලද ණය වගකීම් දරන්නන් වෙනුවෙන් භාරකරුවකු ලෙස යම් තැනැත්තකු පත් කිරීමට විධිවිධාන සලසන නියම ඇතුළත් සුරකු ගිවිසුමක් අදහස් වේ; සහ

"වටිනාකම" යන්නෙන්, කොන්ත්‍රාත්තුවකට සහායක් වීමට ප්‍රමාණවත් යම් ප්‍රතිෂ්ඨාවක් අදහස් වන අතර, ඊට පූර්ව ණයක් හෝ බැරකමක් ද ඇතුළත් වන අතර, ඒ අනුව "අලුත් වටිනාකම" යන්නෙන්, පූර්ව ණයක් හෝ බැරකමක් නොවන වටිනාකම අදහස් වේ.

(2) මේ පනතින් අන්‍යාකාරයකින් ප්‍රකාශිතව විධිවිධාන සලසා ඇති අවස්ථාවක දී හැර, යම් භාණ්ඩ "පාරිභෝගික භාණ්ඩ'' ද "බඩු තොග" ද නැතහොත් " උපකරණ" ද යන්න නිශ්චය කිරීම, සුරකු අයිතිවාසිකම ඇති කරනු ලබන අවස්ථාවේ දී කළ යුතු ය.

(3) 35 වන වගන්තියේ විධිවිධාන සලසා ඇති පරිදි, ලාභ පිළිබඳව සුරකු අයිතිවාසිකමක් ඇති තැනැත්තා සහ ලාභවලට අයිතිවාසිකම් ඇති හෝ ලාභ සම්බන්ධයෙන් ගනුදෙනු සිදු කර ඇති තැනැත්තා අතර විශ්වසනීය සම්බන්ධතාවයක් පැවතුණ ද නොපැවතුණ ද, ඒ ලාභ අනාවරණය කර ගත හැකි ලාභ වන්නේ ය.

**76.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව

රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී